# 4 ශ්‍රේණිය

## මූලික පිරිවෙන්

# ත්‍රිපිටක ධර්මය

## මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර

## Mid Term and Year End Papers

මූලික පිරිවෙන් මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර i-ii



මූලික පිරිවෙන් ත්‍රිපිටක ධර්මය මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර

# ත්‍රිපිටක ධර්මය

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - 4 ශ්‍රේණිය

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2018**<br>Primary Piriven Mid Year Tearm Test - 2018<br>**ශ්‍රේණිය 04 /Grade 04** |

ත්‍රිපිටක ධර්මය — කාලය : පැය තුනයි

Thripitaka Dharmaya — **Time : Three Hours**

සැලකිය යුතුයි :

**I, II** කොටස්වල ප්‍රශ්න සියල්ලටම ද **III** කොටසින් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.

i. නව අරහාදී බුදුගුණවලට අයත් වන්නේ මින් කුමක් ද?

1. ස්වාක්ඛාත ගුණය
2. සුපටිපන්න ගුණය
3. සම්මා සම්බුද්ධ ගුණය
4. සන්දිට්ඨික ගුණය

ii. හික්කඩුවේ සුමංගල නාහිමියන් පැවිදි වූයේ කුමන වර්ෂයේ ද?

1. 1840 දීය
2. 1850 දීය
3. 1853 දීය
4. 1864 දීය

iii. පටාචාරා රහත් තෙරණිය ලැබූ අගතනතුර මින් කුමක්ද?

1. ඍද්ධිමත් භික්ෂුණීන් අතර අගතනතුර
2. විනයධර භික්ෂුණීන් අතර අගතනතුර
3. ධර්මධර භික්ෂුණීන් අතර අගතනතුර
4. ශික්ෂාකාමී භික්ෂුණීන් අතර අගතනතුර

iv. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේ සඳහා විනය නීති පැනවීමට හේතු නොවූයේ මින් කුමක්ද?

1. භික්ෂූන් වහන්සේලා බහුලවීම ය
2. ලාභ ප්‍රයෝජන බහුලවීම ය
3. බහුශ්‍රැතයන් වැඩිවීම ය
4. අනුවණයන් බහුලවීම ය

v "ඒහි පස්සිකො" යනුවෙන් අදහස් වන්නේ මින් කුමක්ද?

1. ඒ මොහොතේ විපාක දීම
2. අර්ථය තමා විසින්ම අවබෝධ කර ගැනීම
3. එන්න බලන්න
4. නිවනට පැමිණවීම

vi. පඨම සාරණීය ධර්මයක් වන්නේ

1. සමාන සම්‍යක්දෘෂ්ටියෙන් යුක්ත විය යුතු බව
2. සමගි බව
3. එකමුතු බව
4. ගෞරව ඇති බව

vii. "ඤත්ති චතුත්ථ කම්ම" උපසම්පදාව යන්නෙන් අදහස් වන්නේ

1. අෂ්ට ගරු ධර්ම පිළිගැනීමෙන් ලබන උපසම්පදාව
2. ඤත්තියක් සමග කර්ම වාක්‍ය කීමෙන් ලැබෙන උපසම්පදාව
3. දූතයෙක් මාර්ගයෙන් යවන උපසම්පදාව
4. තිසරණ සමාදන් කරවීමෙන් ලබාදෙන උපසම්පදාව

viii. සබ්බ චිත්ත සාධාරණ චෛතසික ධර්ම

1. 14 කි
2. 19 කි
3. 06 කි
4. 07 කි

ix. අකුසල රාශියට අයත් වන්නේ

1. මෝහ 2. අලෝභ 3. අදෝස 4. විරිය

x. සමථ භාවනාවේ කර්මස්ථාන

1. 30 කි 2. 10 කි 3. 40 කි 4. 45 කි

xi. " සීලබ්බත පරාමාස" යනු

1. නිවන් දැකීම ය 2. බුදුන් ගැන සැක කිරීම ය
3. සත්ත්වයා සසර බැඳ තිබීම ය 4. ධ්‍යානයට සම වැදීම ය

xii. "දීඝා ජාගරතො රත්ති" යනු

1. රාත්‍රියට සුවසේ නින්දයාම ය 2. සුවසේ අවදි වීම ය
3. නිදි වරන්නාට රාත්‍රිය දිග වීම ය 4. ඒකාන්තයෙන්ම බාලයෙක් වීම ය

xiii. ධම්ම පදය අයත් වන්නේ

1. ඛුද්දක නිකායට යි 2. දීඝ නිකායට යි
3. සංයුක්ත නිකායට යි 4. අංගුත්තර නිකායට යි

xiv. සංස්කාර ධර්මයන්ගේ ප්‍රධාන ලක්‍ෂණයක් නොවන්නේ

1. උප්පාදෝ පඤ්ඤායති 2. යථාහි අංග සම්භාරා පඤ්ඤායති
3. වායො පඤ්ඤායති 4. ඨිතස්ස අඤ්ඤතත්ථං පඤ්ඤායති

xv. අංග සම නිධානය යන්නෙන් අදහස් වන්නේ

1. තමන් සතු රන් රුවන් ය 2. අබුදරුවන් දුසි දස්සන් ය
3. තමා ඉගෙනගත් ශාස්ත්‍ර හා ශිල්පයන් ය 4. දාන, සීල, භාවනා ය

xvi. චතුර්වර්ණයට අයත් වන්නේ

1. ශ්‍රමණ 2. ජටිල 3. නිගණ්ඨ 4. බ්‍රාහ්මණ

xvii. ප්‍රථම ධර්ම සංගායනාවට සහභාගිවූ භික්‍ෂු පිරිස

1. 500 කි 2. 700 කි 3. 1000 කි 4. 300 කි

xviii. "ජලෝගි කප්ප" යනු

1. රන්රිදී මිල මුදල් පිළිගැනීම ය 2. අඟක ලුණු තබා ගැනීම ය
3. රා බවට නොපැමිණි මී රා පානය කිරීම ය 4. වාටියක් නොමැතිව අදනය පරිහරණය කිරීම ය

xix. සංස්කෘතිය යනු

1. ඇදහිලි විශ්වාස සම්ප්‍රදායික පිළිගැනීම 2. එක අරමුණකට පිරිසක් ඒකරාශී වීම
3. ප්‍රාග් බෞද්ධ යුගයේ පිළිගැනීම් 4. මහින්දාගමනයෙන් සිදුවූ වෙනස්කම්

xx. "දියඇළවෝ දිය ගෙන යන්නාක් මෙන්" යන ප්‍රකාශයේ සඳහන් නිවැරදි පාලි වාක්‍ය වන්නේ

1. අත්තානං දමයන්ති පණ්ඩිකා 2. දාරුං නමයන්ති තච්ඡකා
3. උසුකාරා නමයන්ති තෙජනං 4. උදකං හි නයන්ති නෙත්තිකා

(ලකුණු. 1 × 20 = 20)

## II කොටස

පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

01. බුදුගුණ අතරින් දෙකක් නම් කරන්න.
02. "යෙ ලොකෙ අරහන්තො තෙසං උද්දිස්ස අම්හාකං පබ්බජ්ජා" මෙහි අර්ථය දක්වන්න.
03. රත්මලානේ ශ්‍රී ධම්මාලෝක නාහිමියන් විසින් රචිත ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
04. සතර සංවර ශීලයෙන් අංග දෙකක් ලියන්න.
05. උපසම්පදා විනය කර්ම සිදුකරන සීමා වර්ග දෙක නම් කරන්න.
06. පකිණ්ණක චෛතසික ධර්ම හයෙන් දෙකක් නම් කරන්න.
07. ධම්මපීති සුඛං සෙති
    විප්පසන්නෙන චෙතසා...... යන ගාථාව සම්පූර්ණ කරන්න.
08. නිධිකණ්ඩ සූත්‍රයේ දැක්වෙන නිදාන සතරෙන් දෙකක් නම් කරන්න.
09. දස පලිබෝධ අතුරෙන් හතරක් නම් කරන්න.
10. තෙවන ධර්ම සංගායනාවෙන් පසු තම්බපණ්ණි ද්වීපයට වැඩම කළ තෙරුන් වහන්සේලා නම් කරන්න.

(ලකුණු. 2 × 10 = 20)

## III කොටස

1.

**i.** පහත සඳහන් ගාථා අතුරින් දෙකක් සම්පූර්ණ කරන්න.

- නිධීනං ව පවත්තාරං.......
- න භජෙ පාපකෙ මිත්තෙ.......
- ධම්ම පීති සුඛං සෙති......
- යථාපි රහදො ගම්භීරො.....

**ii.** එම සම්පූර්ණ කළ ගාථා දෙකෙහි අර්ථය ලියන්න.

**iii.** ඉන් එක් ගාථාවක නිදාන කතාව ලියන්න.

(ලකුණු. 6+4+5 = 15)

2.

**i.** ධර්ම සංගායනාවක් යනු කුමක් ද?

**ii.** දෙව්දත් තෙරුන් බුදුරදුන්ගෙන් ඉල්ලා සිටි පංච වරය නම් කරන්න.

**iii.** පළමුවන ධර්ම සංගායනාව බුද්ධ ශාසනයේ චිර පැවැත්ම උදෙසා ඉවහල් වූ අයුරු විමසන්න.

(ලකුණු. 4+5+6 = 15)

3.

**i.** භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.

**ii.** දස කසනයන්ගෙන් පහක් ලියන්න.

**iii.** පඨවි කසිනය වඩන අයුරු විස්තර කරන්න.

(ලකුණු. 4+5+6 = 15)

4.

i. පුබ්බකරණ නම් කරන්න.

ii. පැවිදි කිරීමේ විනය කර්මයක් සිදු කරන අයුරු පහදන්න.

iii. විනය කර්ම සිදු කිරීමෙන් භික්ෂූන් වහන්සේට සිදු වන යහපත විස්තර කරන්න.

(ලකුණු. 4+5+6 = 15)

5.

i. නව අරහාදී බුදු ගුණ නම් කරන්න.

ii. බුදුරජාණන් වහන්සේ කාරණා පහකින් "අරහං" නම් වන සේක. එම කාරණා පහ දැක්වෙන ගාථාව ලියන්න.

iii. "අරහං" බුදු ගුණය උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු. 4+5+6 = 15)

6.

i. නවංග ශාස්තෘ සාසනය නම් කරන්න.

ii. ධම්මඤ්ඤූ සූත්‍රයේ දැක්වෙන පරිසඤ්ඤූ යන පදය පැහැදිලි කරන්න.

iii. අංග සම්පූර්ණ භික්ෂුවක් සතු ගුණාංග ධම්මඤ්ඤූ සූත්‍රය ඇසුරින් පහදන්න.

(ලකුණු. 4+5+6 = 15)

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Year Term Test - 2019

4 ශ්‍රේණිය /Grade 4

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

ත්‍රිපිටක ධර්මය — කාලය : පැය තුනයි

**Tripitaka Dharmaya** විභාග අංකය :- ................ Time : Three hours

❖ I, II කොටස්වල ප්‍රශ්න සියල්ලටම ද III කොටසින් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.

## I කොටස

01. දහම් ගුණවලට අයත් වන්නේ මින් කුමක් ද ?
 i. පුරිසධම්ම සාරථී ගුණය
 ii. සන්දිට්ඨික ගුණය
 iii. උජුපටිපන්න ගුණය
 iv. අරහං ගුණය

02. රේරුකානේ චන්දවිමල නාහිමියන් පැවිදි වූයේ කුමන වර්ෂයේ ද ?
 i. 1840 ii. 1900 iii. 1864 iv. 1906

03. විසාකා උපාසිකාව සසුනට පූජා කළ ආරාමය කුමක් ද ?
 i. ජේතවනාරාම ය ii. වේළුවනාරාම ය
 iii. පූර්වාරාම ය iv. පාවාරිකාරාම ය

04. ආසවට්ඨානිය ධර්ම අතර රත්තඤ්ඤු මහත්තතා ලෙස හඳුන්වන්නේ,
 i. ලාභ ප්‍රයෝජන බහුලවීම
 ii. පැවිද්ද ඇති වී බොහෝ කල්ගතවීම ය
 iii. බහුශ්‍රැතයන් බහුල වීම
 iv. සංඝයා පිරිස වශයෙන් බහුලවීම ය

05. සතර සංවර සීලයට අයත් අංගයකි,
 i. පංචසීලය ii. අෂ්ටාංග සීලය
 iii. දස සීලය iv. ප්‍රාතිමෝක්ෂ සංවර සීලය

06. සාරාණීය ධර්ම පිළිපැදීමෙන් ලැබෙන ප්‍රයෝජනයකි,
 i. සමාන අයිතිය ලැබීම ii. පිය ඉපදවීම
 iii. කලකිරීමට පත් නොවීම iv. ආසාව ඇතිවීම

07. උපසම්පදා භික්ෂුවක් අවබෝධයෙන් රැකිය යුතු අනියත ශික්ෂා කොපමණ ද ?
 i. හතරකි ii. දහතුනකි iii. තිහකි iv. දෙකකි

08. නිධි කණ්ඩ සූත්‍රයට අනුව අනුගාමික නිධානයක් වන්නේ,

i. තමන් සතු රන් රුවන් කෙත් වතු ය

ii. අඹු දරුවන් දාසි දාසුන් ය

iii. තමන් ඉගෙනගත් ශාස්ත්‍ර හා ශිල්පයන් ය

iv. තමන් විසින් සිදු කර ගන්නා ලද දාන සීල භාවනාව පින්කම් ය.

09. අභිධර්මයේ චෛතසික කාණ්ඩයට අයත් අන්‍ය සමාන චෛතසිකයකි,

i. වේදනා චෛතසිකය

ii. මෝහ චෛතසිකය

iii. අාලෝභ චෛතසිකය

iv. අදොස චෛතසිකය

10. ත්‍රිවිධ රත්නය රත්න භාවයෙන් හැඳින්වීමට හේතුවන කරුණු අතර ''අතුලං'' යන පදයෙන් හැඳින්වෙන්නේ,

i. කලාතුරකින් දක්නට ලැබෙන බවය.

ii. කිසිවකට සමාන නොවන බවය.

iii. ඉතා අගනා බවය

iv. විසිතුරු බවය

11. ''ආත්තාහි අත්තනො නාථො,' යන පාඨයෙහි සරල අර්ථය වන්නේ,

i. තමාට තමා පිහිටට සිටින බවය.

ii. තමාට තමාවත් පිහිටට නැති බවය

iii. තමාට අනුන් පිහිට වන බවය

iv. තමාට යහළුවන් පිහිට වන බවය

12. සතර ඍද්ධිපාද වලට අයත් වන්නේ,

i. ශ්‍රද්ධා

ii. සති

iii. සමාධි

iv. වීමංසා

13. වජ්ජ දස්සීනං යන පදයේ නිවැරදි අර්ථය වන්නේ,

i. වරදට පොළඹවන්නා

ii. වරදට මඟ කියන්නා

iii. වරද පෙන්වන්නා

iv. වරදට හොඳ කියන්නා

14. අසුභානුස්සති කර්මස්ථානයට අයත් 'උද්ධුමාතක' යන්නෙන් හඳුන්වන්නේ,

i. සැරව වැගිරෙන මළ සිරුරයි

ii. සිදුරු වී ගිය මළ සිරුරයි

iii. කැබලිවලට පත් වූ මළ සිරුරයි

iv. ඉදිමී මිය ගිය මළ සිරුරයි

15. සතර ආසව ධර්මයන්ට අයත් නොවන්නේ,

i. කාමාසව ii. භවාසව

iii. රාගාසව iv. දිට්ඨාසව

16. දස සංයොජන ධර්මයන්හි එන විචිකිච්ඡා ලෙස හඳුන්වන්නේ,

i. අන් අය කෙරෙහි ඇති සැකයයි

ii. බුද්ධාදී අට තැන්හි ඇති සැකයයි

iii. තමන් ගැන ඇතිවන සැකයයි

iv. යහළු මිත්‍රයන් කෙරෙහි ඇතිවන සැකයයි

17. පුද්ගලයාගේ ස්වභාවය අනුව චරිත වර්ග හයකි. ඉන් රාග චරිතයේ ලක්‍ෂණයක් වන්නේ,

i. නිතර කිපෙන සුළු බව

ii. කරුණු වටහා ගැනීමට අපහසු බව

iii. ගැඹුරු සේ තේරුම් ගැනීමේ නුවණ ඇති බව

iv. ලස්සන දේට ප්‍රිය කරන බව

18. "බාලයා පව් පළ නොදෙන තුරු පාපය මී පැණි මෙන් මිහිරි යැයි සිතයි" යන අර්ථය සහිත ගාථා අර්ධය වන්නේ,

i. මාසෙ මාසෙ කුසග්ගෙන - බාලො භුඤ්ජෙථ භොජනං

ii. නහි පාපං කතං කම්මං - - සජ්ජු ඛීරං ව මුච්චති

iii. මධුවා මඤ්ඤති බාලො - - යාවපාපං න පච්චති

iv. තඤ්ච කම්මං කථංසාධු - - යංකත්වා නානුතප්පති

19. සකෘදාගාමී වීමේදී තුනී වී යන සංයෝජන ධර්ම දෙකකි.

i. රූපරාග - අරූප රාග ii. මාන - උද්දච්ච

iii. කාමරාග - පටිඝ iv. සක්කාය දිට්ඨි විචිකිච්චා

20. බුද්ධකාලීනව වාසය කළ ෂට්ශාස්තෘ ඉගැන්වීම් පිළිබඳ විස්තර දක්වෙන සූත්‍රයකි,

i. දම්සක් පැවතුම් සූත්‍රය

ii. ලක්ඛණ සූත්‍රය

iii. බ්‍රහ්මජාල සූත්‍රය

iv. සාමඤ්ඤඵල සූත්‍රය

**(ලකුණු 1 x 20 = 20)**

## II කොටස

පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. දහම් ගුණ හයකි, එයින් දෙකක් නම් කරන්න.
2. ෂට් ශාස්තෘවරුන්ගෙන් දෙදෙනෙකු නම් කරන්න.
3. සංස්කාරයන්ගේ ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න.
4. දෙව්දත් තෙරුන්ගේ පංච වරයෙන් දෙකක් නම් කරන්න.
5. ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵල දෙකක් නම් කරන්න.
6. මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකිකයන්ට ලැබුණ ප්‍රතිඵල දෙකක් ලියන්න.
7. ප්‍රාග් බෞද්ධ යුගයේ ලක්දිව පැවති ඇදහිලි දෙකක් නම් කරන්න.
8. හේන්පිටගෙදර ඥාණසීහ නාහිමියන් රචනා කල ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
9. ධම්මඤ්ඤු සූත්‍රයට අනුව බණ අසනු ලබන පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න.
10. චෛතසිකයන්ගේ ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

## III කොටස

01.

i. පහත සඳහන් ගාථා අතරින් දෙකක් සම්පූර්ණ කරන්න.

* දීඝාජාගාරතෝ රත්තී .....
* චරං චෙ නාධිගච්ඡෙය්‍ය .....
* පුත්තාමත්ථි ධනම්මත්ථි
* යො බාලො මඤ්ඤති බාල්‍යං

ii. එම සම්පූර්ණ කළ ගාථා දෙකෙහි අර්ථය ලියන්න.

iii. ඉන් එක් ගාථාවක නිදාන කථාව ලියන්න.

(ලකුණු 4 + 5 + 6 = 15)

02.

i. බුදුරදුන් අනුදැන වදාළ උපසම්පදා ක්‍රම අටෙන් හතරක් නම් කරන්න.

ii. උපසම්පදා විනය කර්මයක් යනු කුමක්දැයි කෙටියෙන් පහදන්න.

iii. වර්තමානයේ ක්‍රියාත්මක වන ඤත්තිචතුත්ථකම්ම උපසම්පදා විනය කර්මය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

(ලකුණු 4 + 5 + 6 = 15)

03.

i. නවංග ශස්තෘ සාසනයේ අංග හතරක් නම් කරන්න.

ii. ධම්මචක්ඛු සූත්‍රයට අනුව භික්ෂූන් වහන්සේ නමක සතු මත්තඤ්ඤු ඥාණය ලෙස හඳුන්වන්නේ කුමක්දැයි පහදන්න.

iii. වර්තමාන භික්ෂුවගෙන් සිදු වන සමාජ මෙහෙවර පැහැදිලි කරන්න.

(ලකුණු 4 + 5 + 6 = 15)

04.

i. දෙපණස් චෛතසිකයන්හි ප්‍රධාන බෙදීම් දක්වන්න.

ii. ප්‍රකීර්ණක චෛතසික හය නම් කරන්න.

iii. යහපතට හා අයහපතට සිත බලපාන ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 4 + 5 + 6 = 15)

05.

i. දස කසිණයන්ගෙන් හතරක් නම් කරන්න.

ii. සමථ භාවනාව වඩන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. සමාජයම ගැටළු අවම කර ගැනිම සඳහා භාවනාවෙන් ලැබෙන පිටිවහල පිළිබඳ ඇගයීමක් කරන්න.

(ලකුණු 4 + 5 + 6 = 15)

06.

i. පළමු වන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු හතරක් නම් කරන්න.

ii. පළමුවන ධර්ම සංගායනාව පැවැත් වූ ආකාරය පැහැදිලි කරන්න.

iii. පළමුවන ධර්ම සංගායනාව ශාසනයේ ඉදිරි පැවැත්ම සඳහා මූලික වූ අයුරු විස්තර කරන්න.

(ලකුණු 4 + 5 + 6 = 15)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

මධ්‍යවාර පරීක්ෂණය - 2022
இரண்டாம் தவணைப் பரீட்சை - 2022
Mid Year Term Test - 2022

පැය එකයි

**ත්‍රිපිටක ධර්මය I** විභාග අංකය : ......................................... **04 ශ්‍රේණිය**

සැලකිය යුතුයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (i) (ii) (iii) (iv) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40ක් හිමි වේ).
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් පිළිතුර අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. ත්‍රිවිධ රත්නයේ රත්න භාවයට හේතුවන කරුණු අතර **"අනොම සත්ත පරිභොගං"** යනුවෙන් විස්තර වන්නේ
   i. දැකුම්කළු විසිතුරු බව යි.
   ii. මිල කළ නොහැකි තරම් අගනා බව යි.
   iii. උසස්ම මට්ටමේ පුද්ගලයන් විසින් පරිහරණය කරන ලද බව යි.
   iv. සෙසු දේට සමාන නොවන විශේෂ ලක්ෂණ ඇති බව යි.

2. බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ධර්මය තමාට මෙලොව දී ම අත්දැකිය හැකි බැවින් ශ්‍රී සද්ධර්මය,
   (i) අකාලික ය. (ii) එහිපස්සික ය.
   (iii) ඕපනයික ය. (iv) සංදිට්ඨික ය.

3. චතුරාර්ය සත්‍යය අවබෝධ කළ බැවින් ද, අවබෝධ කරවූ බැවින් ද, සියල්ල දන්නා බැවින් ද, සියල්ල දක්නා බැවින් ද තථාගතයන් වහන්සේ,
   (i). සම්මා සම්බුද්ධ වන සේක. (ii). බුද්ධ වන සේක.
   (iii). භගවා වන සේක. (iv). සත්ථා වන සේක.

4. **අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ කේසී සූත්‍රයේ** දී විස්තර වන්නේ තථාගතයන් වහන්සේගේ,
   (i). ලෝකවිදූ බුදු ගුණය පිළිබඳව ය. (ii). අනුත්තර පුරිසදම්ම සාරථී බුදු ගුණය පිළිබඳව ය.
   (iii). සුගත බුදු ගුණය පිළිබඳව ය. (iv). විජ්ජාචරණ සම්පන්න බුදු ගුණය පිළිබඳව ය.

5. ආවරණය වී තිබීම නිසා රැකෙන කාරණා සහ ආවරණය නොවී විවෘතව තිබීම නිසා බැබලෙන කාරණා, අංගුත්තර නිකායේ තික නිපාතයේ භරණ්ඩු සූත්‍රයේ දී දක්වා ඇත. එහි ඇතුළත් කරුණු සංඛ්‍යාව වන්නේ,
   (i). 04 කි. (ii). 05කි
   (iii). 06 කි. (iv). 07 කි.

6. **"එතදග්ගං භික්ඛවේ මම සාවකානං භික්ඛූනං ධුතවාදීනං යදිදං ......................."**
   (i). කුමාරකස්සපො (ii). සාරිපුත්තො
   (iii). කස්සපො (iv).මහා මොග්ගල්ලානො

7. සම්බුද්ධ ශාසනයේ ඕවාද පටිග්ගහණ උපසම්පදාව ලද භික්ෂූන් වහන්සේ වන්නේ,

(i) අස්සජි මහරහතන් වහන්සේ ය. (ii).මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය.

iii. රාහුල මහරහතන් වහන්සේ ය. (iv). මොග්ගල්ලාන මහරහතන් වහන්සේ ය.

8. **රාජ චරිතය, විනය කතිකාවත, සත්‍ය විලාසනී, සංස්කෘත වරනැගිල්ල** යන ග්‍රන්ථ රචනා කළ නූතන යතිවරයන් වහන්සේ වන්නේ,

i. හේන්පිටගෙදර ඤාණසීහ නාහිමියන් ය. ii. රේරුකානේ චන්දවිමල නාහිමියන් ය.

iii. රත්මලානේ ධම්මාලෝක නාහිමියන් ය. iv. හික්කඩුවේ සුමංගල නාහිමියන් ය.

9. නූතන සහ පරපුර සඳහා වටිනා වූ චරිතාදර්ශයක් එකතු කරමින්, තමාගේ ආදාහනය පවා සිදු කිරීමට උපදෙස් ලබා දී තිබූ නූතන යතිවරයන් වහන්සේ වන්නේ,

i. රේරුකානේ චන්දවිමල නාහිමියන් ය. ii මිගෙට්ටුවත්තේ ගුණානන්ද නාහිමියන් ය.

iii. හික්කඩුවේ සුමංගල නාහිමියන් ය. iv වාරියපොල ශ්‍රී සුමංගල නාහිමියන් ය.

10. ආසවට්ඨානීය ධර්මවල **"බාහුසච්ච මහත්තතා"**යනුවෙන් අදහස් වන්නේ,

i. බහුශ්‍රැතයන් හීනවීම ය. ii. බහුශ්‍රැතයන් නැතිවීම ය.

iii. බහුශ්‍රැතයන් වැඩිවීම ය. iv. බහුශ්‍රැතයන් සිටීම ය.

11. විනය පැනවීමේ අපේක්ෂා දහයකි. එහි **සද්ධර්මයේ දීගුකාලීන පැවැත්ම** යනුවෙන් දක්වා ඇත්තේ,

(i) විනයානුග්ගහාය. (ii) සද්ධම්මට්ඨිතියා.

(iii) සංඝඵාසුතාය. (iv) සංඝසුට්ඨුතාය.

12. උභතො විභංගයට අයත් ග්‍රන්ථය වන්නේ,

(i) පරිවාර පාළි, පාරාජික පාළි (ii) මහාවග්ග පාළි, පාචිත්තිය පාළි

(iii) චුල්ලවග්ග පාළි, පරිවාර පාළි (iv) පාරාජික පාළි, පාචිත්තිය පාළි

13. **අකරණීය සික්ඛා පද** හැඳින්විය හැකි වෙනත් නාමයක් වන්නේ,

(i) සංඝාදිසේස (ii) පාචිත්තිය

(iii) පාටිදේසනීය (iv) පාරාජික

14. උපසම්පදා විනය කර්මයේ දී විමසනු ලබන අන්තරායකර ධර්මයක් වන **"අණනොසි"** යනු,

(i) මිනිසෙකු වීම යි. (ii) දාසයෙකු නොවීම යි.

(iii) විසි වයස් සම්පූර්ණ වීම යි. (iv) ණයෙන් මිදුනෙකු වීම යි.

15. ලැබෙන දෙය අල්ප වුව ද එය සමව බෙදා පරිභෝග කිරීම,

(i) අප්පටිවිභත්තභොගී. (ii) සාධාරණභෝගී.

(iii) භුඤ්ජිස්සාභොගී. (iv) අසාධාරණභෝගී.

16. **"යම් භික්ෂුවක් කෙසේ නම් පමණ දන්නේ වෙයි ද"** යන අදහස හැඳින්වීම සඳහා ධම්මඤ්ඤූ සූත්‍රයේ භාවිත වන්නේ,

(i) අත්තඤ්ඤූ. (ii) මත්තඤ්ඤූ.

(iii) අත්ථඤ්ඤූ. (iv) ධම්මඤ්ඤූ.

17. පරලොව යන විට තමා පසුපස අවුත් සැප විපාක දෙන බැවින්,

(i) ථාවර නිධාන නම් වේ. (ii) අංග සම නිධාන නම් වේ.

(iii) ජංගම නිධාන නම් වේ. (iv) අනුගාමී නිධාන නම් වේ.

18. දුක්ඛිත තත්වයට පත් පුද්ගලයාට දෙලොව අභිවෘද්ධිය සඳහා ද උපකාර කළ හැකි වේ නම් එය,

(i) මෙත්තා බ්‍රහ්ම විහරණය යි. (ii) කරුණා බ්‍රහ්ම විහරණය යි.

(ii) මුදිතා බ්‍රහ්ම විහරණය යි. (iv) උපේක්ෂා බ්‍රහ්ම විහරණය යි.

19. **කක්කරපත්ත** නියම් ගම් වැසියන්ට දෙලොව අභිවෘද්ධිය සඳහා තථාගතයන් වහන්සේ දේශිත සූත්‍රය වන්නේ,

(i) නිධිකණ්ඩ සූත්‍රය යි. (ii) කාලාම සූත්‍රය යි.

(iii) කේසී සූත්‍රය යි. (iv) සිගාලක සූත්‍රය යි.

20. සමාජගත මිනිසකු විසින් ජීවන ගමනේ දී හදාරනු ලබන ශාස්ත්‍ර හා පුරුදු පුහුණු කරන ලද විද්‍යා ශිල්ප

(i) ජංගම නිධාන ලෙස නම් කරයි. (ii) අංගසම නිධාන ලෙස නම් කරයි.

(iii) ථාවර නිධාන ලෙස නම් කරයි. (iv) අනුගාමී නිධාන ලෙස නම් කරයි.

21. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී දේශනා කරන ලද ධනය නැසෙන දොරටු අතර **"අක්ඛධුත්තෝ හොති"** ලෙස විස්තර වන්නේ,

(i) ස්ත්‍රී ලෝලියෙකු වෙයි. (ii) සුරා ලෝලියෙකු වෙයි.

(iii) සූදු ලෝලියෙකු වෙයි. (iv) පවට ලෝලියෙකු වෙයි.

22. රටේ පවතින ආර්ථික ගැටලු බොහෝමයකට ප්‍රධාන හේතුව වනුයේ පාලක පක්ෂයේ ඇති ආර්ථික කළමනාකරණයේ දුර්වලතාවයි. එය වෙනස් කිරීමට නම් පාලකයා හා පාලිතයා,

(i) ආරක්ඛ සම්පදාවෙන් යුක්ත විය යුතුය. (ii) සමජීවිකථාවෙන් යුක්ත විය යුතුය.

(iii) උට්ඨාන සම්පදාවෙන් යුක්ත විය යුතුය. (iv) කල්‍යාණමිත්තාවෙන් යුක්ත විය යුතුය.

23. **පකිණ්ණක චෛතසික** එනමින් හඳුන්වන්නේ,

(i) අකුසල් හා කුසල් සිත්වල මිශ්‍රව යෙදෙන නිසා ය. (ii) අකුසල් සිත්වල පමණක් යෙදෙන නිසා ය.

(iii) කුසල් සිත්වල පමණක් යෙදෙන නිසා ය. (iv) සියලුම සිත්වල යෙදෙන නිසා ය.

24. **මානය** සැමවිට ම මිනිසා පහතට හෙළයි, මානය අයත් වන්නේ ……….. චෛතසිකයන්ටය.

(i) අකුසල (ii) ශෝභන සාධාරණ

(iii) විරති (iv) අසාධාරණ ශෝභන

25. අන්‍යසමාන රාශියට අයත් **ඡන්ද චෛතසිකය** යෙදෙන සිත් ප්‍රමාණය වන්නේ.

(i) 60 කි. (ii) 62 කි.

(iii) 69 කි. (iv) 72 කි.

26. **ත්‍රිපිටකයේ ග්‍රන්ථ සියල්ල ගණනින් 31 කි.** ධර්ම විනය පිළිබඳ කරුණු කැටි කරගත් ග්‍රන්ථය අයත් නිකාය වන්නේ,

(i) දීඝ නිකාය (ii) මජ්ඣිම නිකාය

(iii) අංගුත්තර නිකාය (iv) ඛුද්දක නිකාය

27. බාල වග්ගයට අනුව බාලයාගේ ලක්ෂණ අතර **"දුක්කත කම්මකාරී"** යනුවෙන් අදහස් වන්නේ,

(i) දුෂ්කර පවිටු ක්‍රියා කරන්නා. (ii) නරක පවිටු ක්‍රියා කරන්නා.

(iii) උපායශීලී පවිටු ක්‍රියා කරන්නා. (iv) හානිකර පවිටු ක්‍රියා කරන්නා.

28. බුදුරජාණන් වහන්සේ **"තඤ්ච කම්මං කතං සාධු"** යන ගාථාව දේශනා කොට වදාළේ,

(i) සැවැත් නුවර ගොවියා උදෙසා ය. (ii) සුමන මාලාකරු උදෙසා ය.

(iii) උප්පලවණ්ණා තෙරණිය උදෙසා ය. (iv) මුගලන් තෙරුන් උදෙසා ය.

29. ආර්ය අෂ්ටාංගික මාර්ය ත්‍රි ශික්ෂාවන්ට බෙදා දැක්වීමේ දී **සමාධි** කොටසට අයත් වන්නේ,

(i) සම්මා දිට්ඨි, සම්මා ආජීව, සම්මා සති. (ii) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා සංකප්ප.

(iii) සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි. (iv) සම්මා ආජීව, සම්මා සති, සම්මා සංකප්ප.

30. **ඡන්ද, චිත්ත, විරිය, වීමංසා,** අයත් සත්තිස් **බෝධි පාක්ෂික ධර්ම** කොටස වන්නේ,

(i) සතර ඉන්ද්‍රිය ධර්ම. (ii) සතර ඍද්ධිපාද.

(iii) සතර සම්‍යක්ප්‍රධාන. (iv) සතර සතිපට්ඨාන.

31. "**අඤ්ඤාහි ලාභූපනිසා**" යන්නෙහි අර්ථය වන්නේ,

(i) ලාභය හෙවත් ලැබීම වෙනත් එකකි. (ii) ලාභය හෙවත් ලැබීම විශේෂ කරුණකි.

(iii) ලාභය හෙවත් ලැබීම මිනිසාට අවශ්‍ය කරුණකි. (iv) ලාභය හෙවත් ලැබීම අනිවාර්ය කරුණකි.

32. සමසතළිස් කර්මස්ථාන හැඳින්වීමේ දී, එහි සඳහන් "**සබ්බත්ථක හා පාරිහාරීය**" යනුවෙන් දක්වා ඇත්තේ,

(i) කර්මස්ථාන හඳුනා ගන්නා ආකාර දෙක යි. (ii) කර්මස්ථාන බෙදා වෙන් කරන වර්ග දෙක යි.

(iii) කර්මස්ථාන ලබා දෙන පුද්ගලයන් දෙදෙනා යි. (iv) කර්මස්ථානවල ආරම්භක අවස්ථා දෙක යි.

33. දස අසුභ කර්මස්ථානයට අනුව "**පුලවක** " යන්නෙන් අදහස් වන්නේ,

(i) සැරව වැගිරෙන මළ සිරුර යි. (ii) පණුවන් වැහුණු මළ සිරුර යි.

(iii) ලේ වැගිරෙන මළ සිරුර යි. (iv) ඉදිමී ගිය මළ සිරුර යි.

34. සිත කුසල් අරමුණක් විෂයයෙහි **පැවතීම, නැවතීම, සිටීම** ............ නම් වේ.

(i) ආනාපාන සතිය. (ii) සමථය.

(iii) විදර්ශනාව. (iv) අනුස්සතිය.

35. **වැදිරියක බඩ බැඳගෙන සිටින වඳුරු පැටියකු සේ** අප මේ ලෝකය අල්ලා ගෙන සිටින්නේ,

(i) රූප, වේදනා, සඤ්ඤා නිසාවෙනි. (ii) තණ්හා, මාන, දිට්ඨි නිසාවෙනි.

(iii) වේදනා, සඤ්ඤා, සංඛාර නිසාවෙනි (iv) මාන, රූප, සංඛාර නිසාවෙනි.

36. "**නැවත පරලොව උපදී ය යන්න සැක කරයි**" යනුවෙන් හඳුන්වන්නේ,

(i) පුබ්බන්තේන කඞ්ඛති. (ii) අපරන්තේන කඞ්ඛති.

(iii) පුබ්බන්තාපරන්තේන කඞ්ඛති. (iv) සික්ඛාය කඞ්ඛති.

37. **දස සංයෝජන ධර්ම** ප්‍රහාණය කිරීමේ දී අරහත් භාවය දක්වා ම පවතින සංයෝජනය වන්නේ,

(i) විචිකිච්ඡා. (ii) සීලබ්බත පරාමාස.

(iii) රූප රාග. (iv) පටිඝ.

38. **ෂට්ශාස්තෘවරුන්** අතරින් **අජිත කේශකම්බලී**ගේ ඉගැන්වීම වන්නේ,

(i) නියති වාදය, අකිරිය වාදය. (ii) අහේතුක වාදය, උච්ඡේද වාදය.

(iii) ශාස්වත වාදය, අකිරිය වාදය. (iv) නියතිවාදය, ශාස්වත වාදය.

39. දස අකැප වස්තු අතර "**කිරිත් නොවූ, දීකිරිත් නොවූ, කිරි අවේලාවෙහි වැළඳීම කැපය**" යනු,

(i) ජලෝගිකප්ප. (ii) අමථිතකප්ප.

(iii) ආචිණ්ණකප්ප. (iv) අදසක නිසීදනකප්ප.

40. හෙළ සංස්කෘතියේ "**කුල දේවතාවා**" යන ගෞරව නාමයෙන් හඳුන්වා ඇත්තේ,

(i) භික්ෂූන් වහන්සේ ය. (ii) භික්ෂුණීන් වහන්සේ ය.

(iii) උපාසකයන් ය. (iv) උපාසිකාවන් ය.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

මධ්‍යවාර පරීක්ෂණය - 2022
இரண்டாம் தவணைப் பரீட்சை - 2022
Mid Year Term Test - 2022

පැය තුනයි.

**ත්‍රිපිටක ධර්මය II** විභාග අංකය : ........................................ **04 ශ්‍රේණිය**

**I කොටසේ ප්‍රශ්න සියල්ලටම ද, II සහ III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

01. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. පසළොස්වරණ ධර්ම අතරින් **හතරක්** ලියන්න.

ii. ධර්මරත්නයේ ගුණ **පිළිවෙළින් අර්ථය** සමග ලියන්න.

iii. මහාවග්ග පාළියට අයත් ඛන්ධක **හතරක්** නම් කරන්න.

iv. සතර සංවර සීලය නම් කරන්න.

v. සීමා වර්ග **දෙක** නම් කරන්න.

vi. සතර අගති නම් කරන්න.

vii. දස පළිබෝධවලින් දෙකක් නම් කොට ඒවායෙහි අර්ථ ලියන්න.

viii. **"අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං"** ......... යන ගාථාව සම්පූර්ණ කරන්න..

ix. ෂට්ශාස්තෲවරුන් අතුරින් **සිව්දෙනෙකු නම්** කොට ඔවුන්ගේ ඉගැන්වීම් දක්වන්න.

x. දෙවැනි ධර්ම සංගායනාවෙන් පසු බෙදී ගිය ථෙරවාදී ශාඛාවන් එකළොස අතරින් **හතරක්** ලියන්න.

**(ලකුණු 2 x 10 = 20)**

## II – කොටස.

02. I. පහත සඳහන් ගාථාවලින් **දෙකක්** සම්පූර්ණ කරන්න.

i. න භජෙ පාපකෙ මිත්තෙ .......

ii. අප්පකා තෙ මනුස්සෙසු .......

iii. නහි පාපං කතං කම්මං .....

iv. ධම්මපීති සුඛං සෙති ........

II. සම්පූර්ණ කරන ලද එක් ගාථාවක නිදාන කථාව ලියන්න. **(ලකුණු 6 + 4 = 10)**

03. i. සංස්කාර ධර්මයන්ගේ ප්‍රධාන ලක්ෂණ **තුන** ලියන්න.

ii. ත්‍රිලක්ෂණය තුළ දැක්වෙන දුක්ඛ (දුක) ලක්ෂණය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. සමාජ ගැටලු, ප්‍රශ්න මගහරවා ගැනීමට ත්‍රිලක්ෂණාවබෝධය ඉවහල් වන ආකාරය විමසන්න.

**(ලකුණු 2 + 3 + 5 = 10)**

04. i. සසුන එකලු කළ නූතන යතිවරුන් සිව් දෙනෙකු නම් කරන්න.

ii. රේරුකානේ චන්ද්‍රවිමල නාහිමියන්ගේ ශාසනික මෙහෙවර අගයන්න.

iii. ධර්ම ශාස්ත්‍රීය ඉගෙනීම වර්තමාන භික්ෂු ජීවිතයේ සාර්ථකත්වයට තුඩු දෙන ආකාරය හේන්පිටගෙදර ඥාණසීහ නාහිමි චරිතාදර්ශයෙන් පෙන්වා දෙන්න.

**(ලකුණු 2 + 3 + 5 = 10)**

## III – කොටස

05 i. පඨම සාරාණීය සූත්‍රයට අනුව භික්ෂුව විසින් නිතර සිහි කළ යුතු කරුණු **හතරක්** ලියන්න.

ii.‘‘**සීලසාමඤ්ඤතා**’’ යන්න පැහැදිලි කරන්න.

iii. "**සාරාණීය ධර්ම සිහිකිරීම පිරිපුන් භික්ෂු ජීවිතයකට මග පාදයි**" විස්තර කරන්න.

**(ලකුණු 2 + 3 + 5 = 10)**

07. i. අන්‍යසමාන චෛතසික **හතරක්** නම් කරන්න.

ii. චෛතසිකවල පොදු ලක්ෂණ හතර විස්තර කරන්න.

iii. සබ්බචිත්ත සාධාරණ චෛතසික නම් කර, ඒවා එනමින් හැඳින්වීමට හේතු දක්වන්න.

**(ලකුණු 2 + 3 + 5 = 10)**

08. i. පාරාජික පාළියට අනුව විනය නීති පැනවීමේ අරමුණු දහයකි. එයින් **හතරක්** අර්ථ සහිතව ලියන්න.

ii. බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන වදාළ උපසම්පදා ක්‍රම අට පිළිබඳ හැඳින්වීමක් කරන්න.

iii. පරිපූර්ණ භික්ෂු ජීවිතයකට උපසම්පදා වීමේ ඇති වැදගත්කම විමසන්න.

**(ලකුණු 2 + 3 + 5 = 10)**

★ ★ ★

[සියලුම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය - 2023**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2023**
**Mid Year Term Test - 2023**

**පැය එකයි.**

**ත්‍රිපිටක ධර්මය I** **විභාග අංකය : ........................** **04 ශ්‍රේණිය**

සැලකිය යුතුයි.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40 ක් හිමි වේ).
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකය ට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. **ත්‍රිවිධ රත්නය,** රත්න භාවයට පත්වීම සඳහා කරුණු පහක් හේතු වේ. එම කරුණු පහ අතරින් **"කලාතුරකින් දක්නට ලැබෙන බව"** හඳුන්වනු ලබන්නේ,
   I. අතුලං යනුවෙනි. II. දුල්ලභ දස්සනං යනුවෙනි.
   III. අනෝම සත්ත පරිභෝගං යනුවෙනි. IV. මහග්ඝං යනුවෙනි.

2. **"ඒ මළ ඤාතීන් නිසා නුඹ හැඬූ කඳුලු සප්ත මහා සාගරයේ ජල කඳටත් වඩා වැඩියැ යි"** වදාරා දහම් දේශනා කරන ලද්දේ,
   I. පටාචාරාවට ය. II. කිසාගෝතමීට ය.
   III. භද්‍රාකාපිලානියට ය. IV. යශෝධරා දේවීට ය.

3. අංගුත්තර නිකායේ තික නිපාතයේ **භරණ්ඩු වග්ගයේ** සඳහන් වන වැසී ආවරණය වී තිබීම නිසා රැකෙන කාරණා තුනට අයත් වන්නේ,
   I. කාන්තාව යි. II. සඳමඬල යි.
   III. හිරුමඬල යි. IV. තථාගත ධර්මය යි.

4. විනය පිටකය සඳහා රචනා කරන ලද අටුවා ග්‍රන්ථය වන්නේ,
   I. පපඤ්චසූදනීය යි. II. සුමංගලවිලාසිනිය යි.
   III. මනෝරථපූරණිය යි. IV. සමන්තපාසාදිකාව යි.

5. තථාගතයන් වහන්සේ විසින් ශ්‍රී සද්ධර්මය මනා කොට දේශනා කරන ලද බැවින්,
   I. ඒහිපස්සිකො නම් වේ. II. ඕපනයිකො නම් වේ.
   III. අකාලිකො නම් වේ. IV. ස්වාක්ඛාතො නම් වේ.

6. **"භද්‍රාකාපිලානිය, මම ගිහි ගෙයින් නික්ම පැවිදි වනු කැමැත්තෙමි. එබැවින් මා හා විවාහ ප්‍රාප්තව පසුතැවිලි නොවන්න. ඔබ සුදුසු පරපුරකින් පුරුෂයෙකු ලැබ විවාහ වන්නැයි "** බිරිඳට කල් ඇතිව ම කියන ලද මානවකයා වූයේ,
   I. කපිල ය. II. පිප්ඵලී ය.
   III. කෝසිය ය. IV. අසිත ය.

7. **"තුන්කල්හිම පැවති - පදරුත් සියල් ලොව ඇති"** යන කවියෙන් අදහස් වන්නේ,
   I. අරහං බුදු ගුණය යි. II. සම්මා සම්බුද්ධ බුදු ගුණය යි.
   III. භගවා බුදු ගුණය යි. IV. බුද්ධ බුදු ගුණය යි.

8. මරණානුස්සතිය වඩමින් උතුම් වූ රහත් ඵලයට පත් වූයේ,

I. රාහුල තෙරුන් ය.
II. ආනන්ද තෙරුන් ය.
III. පටාචාරා තෙරණිය ය.
IV. උප්පලවණ්ණා තෙරණිය ය.

9. ගෞතම බුදුසසුනේ විනයධාරී භික්ෂුණීන් අතර අග තනතුරට පත් වූයේ,

I. කිසාගෝතමී තෙරණිය යි.
II. පටාචාරා තෙරණිය යි.
III. උප්පලවණ්ණා තෙරණිය යි.
IV. මහා ප්‍රජාපතිගෝතමී තෙරණිය යි.

10. පිරිකර සහ ආරාමික භාණ්ඩ පරිහරණය පිළිබඳ විනය නීති සඳහන් වන්නේ, විනය පිටකයේ මහා වග්ගපාළියේ,

I. මහාක්ඛන්ධකයේ ය.
II. උපොසථක්ඛන්ධකයේ ය.
III. චම්මක්ඛන්ධකයේ ය.
IV. භෙසජ්ජක්ඛන්ධකයේ ය.

11. ධම්මඤ්ඤු සූත්‍රයට අනුව **"පරිසඤ්ඤු"** යන්නෙහි අදහස වන්නේ,

I. පමණ ගැන දැන ගැනීම යි.
II. කාලය ගැන දැන ගැනීම යි.
III. අර්ථය ගැන දැන ගැනීම යි.
IV. පිරිස් ගැන දැන ගැනීම යි.

12. රත්මලානේ ධම්මාලෝක නාහිමියන් ආරම්භ කළ අධ්‍යාපන ආයතනය අයත් වරණය වන්නේ,

I. විද්‍යාලංකාර විද්‍යාස්ථානය යි.
II. විද්‍යෝදය විද්‍යාස්ථානය යි.
III. පරමධම්මචේතිය විද්‍යාස්ථානය යි.
IV. විජයානන්ද විද්‍යාස්ථානය යි.

13. මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ මූලිකත්වයෙන් ප්‍රථම ධර්ම සංගායනාව පවත්වන ලද්දේ සම්බුද්ධ පරිනිර්වාණයෙන්,

I. වසරකට පසුව ය.
II. හය මසකට පසුව ය.
III. සිව් මසකට පසුව ය.
IV. තෙමසකට පසුව ය.

14. චතු පාරිශුද්ධියට අයත් **ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලයෙන්** ගම්‍ය වන්නේ,

I. ඇසින් රූප දැක නිමිති වශයෙන් නොගෙන පංච ඉන්ද්‍රියන් සංවර කර ගැනීම යි.
II. ප්‍රත්‍යවේක්ෂාවෙන් යුතු ව ප්‍රත්‍ය පරිභෝග කිරීම යි.
III. ජීවන පිළිවෙත පිරිසිදුව තබා ගැනීම යි.
IV. ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත වීම යි.

15. **"මහණ මෙහි එන්න, මැනවින් දුක් කෙළවර කරනු පිණිස බඹසරෙහි හැසිරෙන්නැ යි"** බුදුරජාණන් වහන්සේ විසින් වදාරා ලබා දුන් උපසම්පදාව හඳුන්වනු ලබන්නේ,

I. සරණාගමන උපසම්පදාව නමින් ය.
II. පඤ්හව්‍යාකරණ උපසම්පදාව නමින් ය.
III. ඒහිභික්ඛු උපසම්පදාව නමින් ය.
IV. දූතේන උපසම්පදාව නමින් ය.

16. **"අකරණීය ධර්ම"** හඳුන්වනු ලබන වෙනත් නාමයක් වන්නේ,

I. සංඝාදිසේ ය.
II. අනියත ය.
III. නිස්සග්ගිය පාචිත්ති ය.
IV. පාරාජිකා ය.

17. උපසම්පදා විනය කර්මය අවසන් වන තුරු ම උපාධ්‍යායන් වහන්සේ හඳුන්වනු ලබන්නේ,

I. තිස්ස යනුවෙනි.
II. නාග යනුවෙනි.
III. ආචරිය යනුවෙනි.
IV. උපාධ්‍යාය යනුවෙනි.

18. **A** කොටසෙහි සඳහන් පාලි පදවලට ගැළපෙන අර්ථ **B** කොටසෙහි ඇතුළත් වේ. **A** කොටසෙහි පාලි පදවල පිළිවෙළට අනුව, **B** කොටසෙහි නිසි අක්ෂර පිළිවෙළ සහිත වරණය තෝරන්න.

| **A** කොටස | **B** කොටස |
|---|---|
| I. පියකරුණා | A. සමගිය පිණිස |
| II. ගරුකරුණා | B. ගෞරව ඇති බව |
| III සංගහාය | C. ප්‍රිය උපදවන |
| IV සාමග්ගියා | D. සංග්‍රහ පිණිස වන |

I. B, A, C, D
II. C, A, B, D
iii. A, B, C, D
iv. C, B, D, A

19. දම්සක්පැවතුම් සූත්‍ර දේශනාවට අර්ථ විවරණ සපයමින් දේශනා කරන ලද්දේ,
I. මාරතජ්ජනීය සූත්‍රය යි.
II. සච්චවිභංග සූත්‍රය යි.
III. මහානිදාන සූත්‍රය යි.
IV. ධම්මසඞ්ඝ සූත්‍රය යි.

20. පඨම සාරාණීය සූත්‍රයේ එන **"සාධාරණභොගී"** යන පදයෙහි අදහස වන්නේ,
I. ලැබෙන දෙය සඟවාගෙන පරිභෝග කිරීම යි.
II. ලැබෙන දෙය කිසිවෙකුටත් නොදී පරිභෝග කිරීම යි.
III. ලැබෙන දෙය තෝරා ගෙන පරිභෝග කිරීම යි.
IV. ලැබෙන දෙය අල්ප වුවද කිසිවෙකුටත් අඩුවක් නොතබා බෙදා ගෙන පරිභෝග කිරීම යි.

21. **"අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසනසෝභන"** යන ගෞරව නාමය පිරිනැමුණු මහ තෙරුන් වහන්සේ වන්නේ,
I. රත්මලානේ ධම්මාලෝක නාහිමියන් ය.
II. හික්කඩුවේ සුමංගල නාහිමියන් ය.
III. රේරුකානේ චන්දවිමල නාහිමියන් ය.
IV. හේන්පිටගෙදර ඤාණසීහ නාහිමියන් ය.

22. නිධිකණ්ඩ සූත්‍රයේ සඳහන් පරිදි තමන් සතු **"රන්රුවන්, කෙත්වතු, ඉඩකඩම්"** ආදිය තිබූ තැනම පවතින බැවින්, එය හැඳින්වෙන්නේ,
I. ජංගම නිධාන නමින් ය.
II. ථාවර නිධාන නමින් ය.
III. අංගසම නිධාන නමින් ය.
IV. අනුගාමික නිධාන නමින් ය.

23. සබ්බචිත්ත සාධාරණ චෛතසික ධර්මයන්ට අයත් වන්නේ,
I. වේදනා චෛතසිකය යි.
II. විතක්ක චෛතසිකය යි.
III. විරිය චෛතසිකය යි.
IV. පීති චෛතසිකය යි.

24. ත්‍රිපිටකයේ සමස්ත ග්‍රන්ථ ප්‍රමාණය වන්නේ,
I. තිස්එකකි.
II. තිස්හතරකි.
III. හතලිහකි.
IV. පනස්හතරකි.

25. **"ගාමිණීගීත නාම ජෙට්ඨ ගාමිණී චරිතය, මහා පැරකුම්බා සිරිත, ලෝකය, සසර, ඛන්ධක විනය"** ආදි ග්‍රන්ථ රචනා කරන ලද්දේ,
I. රත්මලානේ ධම්මාලෝක නාහිමියන් ය.
II. හික්කඩුවේ සුමංගල නාහිමියන් ය.
III. රේරුකානේ චන්දවිමල නාහිමියන් ය.
IV. හේන්පිටගෙදර ඤාණසීහ නාහිමියන් ය.

26. රූපය හෙවත් කය අප මැරුණුවිට අවසන් වෙයි. කායික වේදනාවත් එතනින් අවසන් වෙයි. එම මරණාසන්න අවස්ථාවෙහි ඇති වන සිත හඳුන්වනු ලබන්නේ,
I. පටිසන්ධි සිත යනුවෙනි.
II. භවාංග සිත යනුවෙනි.
III. චුති සිත යනුවෙනි.
IV. අකුසල සිත යනුවෙනි.

27. වජ්ජිපුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත් කරන ලද දස අකැප වස්තුව පිළිබඳ සඳහන් වන ග්‍රන්ථයක් වන්නේ,
I. බෝධිවංසය යි.
II. ථූපවංසය යි.
III. එළුඅත්තනගලු වංසය යි.
IV. දාඨාවංසය යි.

28. සතර ඍද්ධිපාදයන්ට අයත් වන්නේ,
I. ඡන්දය යි.
II. සමාධිය යි.
III. පඤ්ඤාව යි.
IV. සතිය යි.

29. **"ජාති, ජරා, මරණ ආදිය ස්වභාව කොට ඇති දුක්, අප වෙත නො එන්නේ නම් මැනවැ යි සිතමු"** යන අදහස විශද කරමින් සැරියුත් මහ රහතන් වහන්සේ දේශනා කළ සූත්‍රයක් වන්නේ,
I. දසුත්තර සූත්‍රය යි.
II. සච්චවිභංග සූත්‍රය යි.
III. මධුපිණ්ඩික සූත්‍රය යි.
IV. මාරතජ්ජනීය සූත්‍රය යි.

30. **"පෙර තමා සසර ඉපදී සිටියා දැ යි සැක කරයි"** මෙම අදහස දැක්වෙන පාලි පාඨය වන්නේ,

I. පුබ්බන්තේ කඞ්ඛති යනුවෙනි. II. බුද්ධෙ කඞ්ඛති යනුවෙනි.
III. සික්ඛාය කඞ්ඛති යනුවෙනි. IV. අපරන්තේ කඞ්ඛති යනුවෙනි.

31. ............................................... කාමරාග හා පටිඝ යන සංයෝජන ක්‍ෂය වේ.

I. අනාගාමි වීමේ දී II. සකෘදාගාමි වීමේ දී
III. සෝවාන් වීමේ දී IV. අරහත් වීමේ දී

32. වජ්ජිපුත්තක භික්ෂූන් මහාදේව තෙරුන්ගේ මූලිකත්වයෙන් වෙනම සංගායනාවක් පැවැත් වූ අතර, එහි දී ඔවුහු ........................................ නමින් නව නිකායක් බිහි කළහ.

I. ගෝකුලික II. බාහුලික
III. මහාසාංඝික IV. එකබ්බෝහාරික

33. ෂට් ශාස්තෘවරු අතරින් **"උච්ඡේදවාදය"** ඉදිරිපත් කළ ශාස්තෘවරයා වූයේ,

I. පකුධකච්චායන යි. . II. නිගණ්ඨනාථපුත්ත යි.
III. අජිතකේසකම්බල යි. IV. සංජයබෙල්ලට්ඨිපුත්ත යි.

34. **"මෝහ, අහිරික, උද්ධච්ච, ඉස්සා"** යන චෛතසික අයත් වන්නේ,

I. කුසල චෛතසිකයන්ට ය. II. අකුසල චෛතසිකයන්ට ය.
III. ප්‍රකීර්ණක චෛතසිකයන්ට ය. IV. සබ්බචිත්තසාධාරණ චෛතසිකයන්ට ය.

35. සද්ධර්මයේ ආරක්‍ෂාව හා චිර පැවැත්ම උදෙසා ධර්ම, විනය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාම සඳහා සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පිරිසට භාර වූයේ,

I. මජ්ඣිමනිකාය යි. II. දීඝනිකාය යි.
III. සංයුත්තනිකාය යි. IV. අංගුත්තර නිකාය යි.

36. බුද්ධකාලීන ශ්‍රමණ සමාජයේ මූලික ලක්ෂණයක් වන්නේ,

I. මහා බ්‍රහ්මයාගේ නිර්මාණවාදය පිළිගැනීම යි.
II. යාග හෝම පවත්වා දෙවියන්ට පූජා පැවැත්වීම යි.
III. විමුක්තිය පිණිස ඥාන මාර්ගය වැඩීම යි.
IV. චතුර්වේද ග්‍රන්ථ පිළිගැනීම යි.

37. ෂට් ශාස්තෘවරු අතර සිටි නිගණ්ඨනාථපුත්තයන් ගේ ඉගැන්වීමක් වන්නේ,

I. පරම අවිහිංසාවාදය යි. II. අමරාවික්ඛේපවාදය යි.
III. සංශයවාදය යි. IV. අකිරියවාදය යි.

38. දස සංයෝජන ධර්ම අතර, සිත එක අරමුණක රඳවා තබා ගැනීමට අපහසු විසිර ගිය ස්වභාවය හඳුන්වා ඇත්තේ,

I. විචිකිච්ඡා ලෙස ය. II. කාමරාග ලෙස ය.
III. රූපරාග ලෙස ය. IV. උද්ධච්ච ලෙස ය.

39. දිව්‍ය ලෝකය, මනුෂ්‍ය ලෝකය සහ සතර අපාය යන කාමභවයන්හි රැඳෙන, බැවින් ඒවා **ඕරම්භාගිය සංයෝජන** නම් වේ. එයට අයත් වන්නේ,

I. රූප රාගය යි. II. මානය යි.
III. උද්ධච්චය යි. IV. සීලබ්බත පරාමාසය යි.

40. තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස, ධර්මාශෝක රජු නවරට සසුන් පිහිට වීය. ඒ සඳහා **මහිස මණ්ඩලයට වැඩම කළේ,**

I. මජ්ඣන්තික තෙරුන් වහන්සේ ය. II. මහාදේව තෙරුන් වහන්සේ ය.
III. රක්ඛිත තෙරුන් වහන්සේ ය. IV. මජ්ඣිම තෙරුන් වහන්සේ ය.

***************

[ සියලුම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය** - 2023
**இரண்டாம் தவணைப் பரீட்சை** - 2023
**Mid Year Term Test** - 2023

**පැය තුනයි.**

**ත්‍රිපිටක ධර්මය II** **විභාග අංකය : ......................** **04 ශ්‍රේණිය**

**I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II සහ III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද, තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I - කොටස

01. **පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. විජ්ජාචරණ සම්පන්න බුදුගුණයෙහි ඇතුළත් අෂ්ටවිද්‍යා අතරින් **හතරක්** නම් කරන්න.
ii. ෂට් ශාස්තෘවරු පිළිබඳ තොරතුරු ඇතුළත් ත්‍රිපිටකාගත සූත්‍ර **හතරක්** නම් කරන්න.
iii. උපසම්පදා භික්ෂුවක විසින් පිරිය යුතු සීලයෙහි **සතර** ආකාරය නම් කරන්න.
iv. නිධිකණ්ඩ සූත්‍රයට අනුව පුද්ගල යහපත සඳහා හේතුවන නිධාන **හතර** නම් කරන්න.
v. අන්‍යසමාන චෛතසික බෙදෙන **ප්‍රධාන කොටස් දෙක සංඛ්‍යාව** සමඟ වෙන වෙන ම ලියන්න.
vi. සප්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ට ඇතුළත් **සත්ත බොජ්ඣංග අතරින් හතරක්** නම් කරන්න.
vii. නිගණ්ඨනාථපුත්ත ශාස්තෘවරයා ඉදිරිපත් කළ පඤ්ච විරති අතරින් **හතරක්** නම් කරන්න.
viii. වජ්ජිපුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත් කළ දස අකැප වස්තු අතරින් **හතරක්** නම් කරන්න.
ix. ප්‍රාග් මහින්ද යුගයේ පැවති ආගමික විශ්වාස **හතරක්** නම් කරන්න.
x. සමසතළිස් කර්මස්ථානයන්ට අයත් **සතර ආරුප්ප** නම් කරන්න.

**(ලකුණු 2×10 = 20)**

## II කොටස

02. i. **"අනුත්තරො පුරිසදම්ම සාරථී"** බුදුගුණයට අදාළ බුදුගුණාලංකාර කවිය ලියන්න.
ii. පුද්ගලයන් දමනය කිරීම පිළිබඳ **කේසී සූත්‍රයේ** සඳහන් ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
iii. **"සම්මා සම්බුද්ධ ගුණය"** පිළිබඳ ව ප්‍රමාණවත් විස්තරයක් කරන්න.

**(ලකුණු 2+3+5 = 10)**

03. I. පහත සඳහන් ගාථා අතරින් **දෙකක්** සම්පූර්ණ කරන්න.

i. යාවජීවම්පි චේ බාලෝ ............
ii. න තං කම්මං කතං සාධු ...........
iii. යථාපි රහදෝ ගම්භීරෝ .........
iv. ඕවදෙය්‍යානුසාසෙය්‍ය ...........

II. සම්පූර්ණ කරන ලද එක් ගාථාවකට අදාළ නිදාන කතාව ලියන්න.

**(ලකුණු 3+3+4 = 10)**

04. i. භාවනාවෙහි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

ii. සමථ භාවනාවට අයත් සම සතළිස් කර්මස්ථාන බෙදී යන ආකාරය දක්වන්න.

iii. දස කසිණ අතරින් ඔබ කැමති කසිණයක් තෝරා ගෙන එම කසිණයට අදාළ භාවනාව වඩන ආකාරය විස්තර කරන්න.

**(ලකුණු 2+3+5 = 10)**

## III - කොටස

05. i. **"ආසවට්ඨානීය"** ධර්ම **සතර** නම් කරන්න.

ii. සමන්තපාසාදිකා අටුවා නිර්වචනයට අනුව **"විනය"** පැහැදිලි කරන්න.

iii. **"සුපේශල ශික්ෂාකාමී භික්ෂු පරපුරක් ගොඩනැගීම උදෙසා"** විනය පිටකයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

**(ලකුණු 2+3+5 = 10)**

06. i. **ධම්මඤ්ඤූ සූත්‍රය**ට අනුව ධර්මය ඇසීමට කැමති පුද්ගලයන් දෙදෙනා නම් කරන්න.

ii. භික්ෂුවක් විසින් දැනගත යුතු ධර්ම අතරින් **"කාලඤ්ඤූ"** යන්න ධම්මඤ්ඤූ සූත්‍රයට අනුව පැහැදිලි කරන්න.

iii. **"ධම්මඤ්ඤූ සූත්‍රය සාර්ථක භික්ෂු ජීවිතයකට මගපාදයි"** පැහැදිලි කරන්න.

**(ලකුණු 2+3+5 = 10)**

07. i. අකුසල චෛතසික **හතරක්** නම් කරන්න.

ii. **"මාන"** චෛතසිකයෙහි ප්‍රභේද **තුන** අර්ථය සමඟ ලියන්න.

iii. අකුසල් චෛතසිකවලින් යුතු සිතක ස්වභාවය පැහැදිලි කරන්න.

**(ලකුණු 2+3+5 = 10)**

*************

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - சிறப்புக் கல்விப் பிரிவு

| 03 | S | I |
|---|---|---|

පැය එකයි

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2024

## 04 ශ්‍රේණිය

## (03) ත්‍රිපිටක ධර්මය

## ත්‍රිපිටක ධර්මය - I

සැලකිය යුතුයි

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (i) (ii) (iii) (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40ක් හිමි වේ.)
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් පිළිතුර අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. **''තුන් කල්හි ම පැවති පදරුත් සියල් ලොව ඇති''** යන කවි පදයෙන් අදහස් වන බුදු ගුණය වන්නේ,
   1. අරහං ගුණය යි.
   2. සම්මා සම්බුද්ධ ගුණය යි.
   3. විජ්ජාචරණ ගුණය යි.
   4. සුගත ගුණය යි.

2. තථාගතයන් වහන්සේ විසින් ශ්‍රී සද්ධර්මය මනාව දේශනා කරන ලද බැවින්,
   1. ස්වාක්ඛාත වේ.
   2. අකාලික වේ.
   3. සන්දිට්ඨික වේ.
   4. ඕපනයික වේ.

3. තමා පෙර සසර ගත කළ කඳ පිළිවෙළ දැකීමේ නුවණ,
   1. ආසවක්ඛය ඥාණය යි.
   2. දිබ්බ චක්ඛු ඥාණය යි.
   3. චුතූපපාත ඥාණය යි.
   4. පුබ්බේනිවාසානුස්සති ඥාණය යි.

4. **''පදුමුත්තර බුදුරජාණන් වහන්සේ හමුවේ එක්තරා භික්ෂුණියක විනයධර භික්ෂුණියන් අතරින් අග්‍රස්ථානයෙහි පිහිටවනු දැක, මම ද යම් බුදුවරයෙකු හමුවේ මෙම තනතුර ලබන්නෙමි''** යැ යි ප්‍රාර්ථනා කරන ලද්දේ,
   1. පටාචාරා තෙරණිය යි.
   2. භද්දකච්චායනා තෙරණිය යි.
   3. උප්පලවණ්ණා තෙරණිය යි.
   4. කිසාගෝතමී තෙරණිය යි.

5. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් දෙවෙනි බුදුවරයෙකු මෙනි යන ප්‍රකාශය කරන ලද්දේ,
   1. ඇන්ටොබ් ප්‍රාන්ස් විසිනි.
   2. මැක්ස් මුලර් විසිනි.
   3. හර්බට් ස්පෙන්සර් විසිනි.
   4. එමිල්ඩුර්කයිම් විසිනි.

6. පරාජික පාලියෙහි සඳහන් විනය නීති පැනවීමේ අපේක්ෂා දහය අතුරින් **''සද්ධම්මට්ඨිතියා''** යන්නෙහි සරල අදහස වන්නේ,
   1. සංඝයාගේ යහපත උදෙසා ය.
   2. සද්ධර්මයේ පරිහානිය නැවතීම උදෙසා ය.
   3. සද්ධර්මයේ දිගුකාලීන පැවැත්ම උදෙසා ය.
   4. සංඝයාට සද්ධර්මය ඉගැන්වීම උදෙසා ය.

7. **''ඉදී කහ පැහැ ගැන්වී නටුවෙන් ගැලවී ගිය ශාක පත්‍රයක් යළි නිල්වන් වීමට යම් සේ නො හැකි වේ ද, එලෙසින් ම පැවිද්දාගේ පැවිදි බව නැති වී යයි. ''** මෙම ප්‍රකාශයට අදාළ ආපත්තිය නිවැරදිව ඇතුළත් වරණය වනුයේ,
   1. සංඝාදිසේසාපත්ති
   2. අනියතාපත්ති
   3. දුක්කටාපත්ති
   4. පරාජිකාපත්ති

8. පඨම සාරාණීය සූත්‍රයට අනුව **''සාරාණීය ධර්ම''** ලෙස සැලකෙන්නේ,
   1. සිහි කළ යුතු ධර්ම ය.
   2. හැදෑරිය යුතු ධර්ම ය.
   3. මතක තබා ගත යුතු ධර්ම ය.
   4. පිළිපැදිය යුතු ධර්ම ය.

9. **පහත A කොටසෙහි සඳහන් පාලි පදවලට ගැළපෙන අර්ථ B කොටසෙහි ඇතුළත් වේ. A කොටසෙහි පාලි පදවල පිළිවෙළ අනුව B කොටසෙහි නිසි අක්ෂර පිළිවෙළ සහිත වරණය තෝරන්න.**

| A කොටස | | B කොටස |
|---|---|---|
| i. | මහාක්ඛන්ධක | A කඨිනය පිළිබඳ නීති |
| ii. | චීවරක්ඛන්ධක | B බෙහෙත් වර්ග භාවිතාව පිළිබඳ නීති |
| iii. | කඨිනක්ඛන්ධක | C පැවිදි කිරීම පිළිබඳ නීති |
| iv. | භේසජ්ජක්ඛන්ධක | D සිවුරු පිළිබඳ නීති |

1. B,A,C,D 2. D,C,A,B 3. C,D,A,B 4. A,C,D,B

10. **"දූතේන උපසම්පදා"** යන්නෙන් අර්ථවත් කරනු ලබන්නේ,
1. තිසරණය සමාදන් කරවීමෙන් ලබා දෙන උපසම්පදාව ය.
2. ඤත්තිය සමග කර්ම වාක්‍ය කීමෙන් ලබා දෙන උපසම්පදාව ය.
3. බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද අවවාද පිළිගැනීමෙන් ලබා දෙන උපසම්පදාව ය.
4. දූතයෙකු මාර්ගයෙන් ලබා දෙන උපසම්පදාව ය.

11. **"රාජ චරිතය, විනය කතිකාව, සත්‍යවිලාසිනි, සංස්කෘත වරනැගිල්ල"** යන ග්‍රන්ථ රචනා කරන ලද්දේ,
1. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් විසිනි.
2. රත්මලානේ ශ්‍රී ධම්මාලෝක නාහිමියන් විසිනි.
3. හේන්පිටගෙදර ඤාණසීහ නාහිමියන් විසිනි.
4. රේරුකානේ චන්දවිමල නාහිමියන් විසිනි.

12. කර්මස්ථාන ලබා දීමේ දී පුද්ගල චරිත හයකට බෙදා ඇත. ඉන් රාග චරිතයාට වඩාත් සුදුසු කමටහන් වන්නේ,
1. සතර බ්‍රහ්ම විහරණ හා වර්ණ කසින හතර
2. බුද්ධ, ධම්ම, සංඝ හා දේවතානුස්සති
3. දස අසුභය හා කායගතාසතිය
4. මරණානුස්සතිය හා ධාතු මනසිකාරය

13. ධම්මඤ්ඤු සූත්‍රයෙහි සඳහන් **"අත්තඤ්ඤු"** යනුවෙන් හැඳින්වෙන්නේ,
1. පිරිස පිළිබඳ ව දැන ගැනීම ය.
2. කාලය පිළිබඳ ව දැන ගැනීම ය.
3. තමා පිළිබඳ ව දැන ගැනීම ය.
4. අර්ථය පිළිබඳ ව දැන ගැනීම ය.

14. **පහත A කොටසෙහි සඳහන් පාලි පදවලට ගැළපෙන අර්ථ B කොටසෙහි ඇතුළත් වේ. A කොටසෙහි පාලි පදවල පිළිවෙළ අනුව B කොටසෙහි නිසි අක්ෂර පිළිවෙළ සහිත වරණය තෝරන්න.**

| A කොටස | | B කොටස |
|---|---|---|
| i. | ථාවර නිධාන | A. තමන් ඉගෙන ගත් ශාස්ත්‍රය ආදිය |
| ii. | ජංගම නිධාන | B. දාන, ශීල, භාවනා වශයෙන් එක් රැස් කළ පින් දහම් ආදිය |
| iii. | අංග සම නිධාන | C. තමන් සතු රන්රුවන්, කෙත්වතු ආදිය |
| iv. | අනුගාමික නිධාන | D. අඹුදරුවන්, දැසි, දසුන් ආදිය |

1. B,A,C,D 2. C,D,A,B 3. C,D,B,A 4. A,C,D,B

15. පුණ්‍ය නිධානයන් තුළින් ලැබෙන **"සුවණ්ණතා"** යන්නෙන් අර්ථවත් වන්නේ,
1. සමෙහි රන්වන් පැහැය ය.
2. සිහින් සිරුරකින් යුක්ත බව ය.
3. සිරුරෙහි පිරිපුන් බව ය.
4. මනා රූ සපුවකින් යුක්ත බව ය.

16. චෛතසික ධර්මයන්හි ඇති ප්‍රධාන ලක්ෂණ අතර **"එක නිරොධ"** යන්නෙහි අදහස ඇතුළත් වරණය වන්නේ,
1. සිත සමග ඉපදීම ය.
2. සිත ගත් අරමුණ ගැනීම ය.
3. සිත් සමග නැතිවී යාම ය.
4. ඒ අවස්ථාවේ ඇසුරු කළ වස්තුව ඇසුරු කිරීම ය.

17. පඨම සාරාණීය සූත්‍රයෙහි සඳහන් වන **"එකීයභාවා"** යන පදයේ අර්ථය වන්නේ,
1. ගෞරවය ඇතිවනු පිණිස හේතු වන බව ය.
2. සංග්‍රහය පිණිස හේතු වන බව ය.
3. එකමුතු බව පිණිස හේතු වන බව ය.
4. සමගිය පිණිස හේතු වන බව ය.

18. පකිණ්ණක චෛතසික පමණක් ඇති වරණය තෝරන්න.
1. විතක්ක, විචාර, එකග්ගතා, වේදනා, සඤ්ඤා, ඵස්ස
2. විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය, පීති, ඡන්ද
3. විතක්ක, ඵස්ස, වේදනා, සුඛ, විරිය, ඡන්ද
4. විතක්ක, පීති, වේදනා, එකග්ගතා, විරිය, චේතනා

19. **පහත A කොටසෙහි සඳහන් පාලි පදවලට ගැළපෙන අර්ථ B කොටසෙහි ඇතුළත් වේ. A කොටසෙහි පාලි පදවල පිළිවෙළ අනුව B කොටසෙහි නිසි අක්ෂර පිළිවෙළ සහිත වරණය තෝරන්න.**

| A කොටස | B කොටස |
|---|---|
| i. මෝහ | A. අනුන් හා තමන් සංසඳනය කරමින් මැනීම |
| ii. දිට්ඨි | B. අරමුණු වරදවා දැකීම |
| iii. මාන | C. අනුන්ගේ සැපත නො ඉවසීම |
| iv. ඉස්සා | D. සිතේ අරමුණුවල සැබෑ තත්ත්වය තේරුම් නො ගැනීම |

1. B,A,C,D
2. C,D,A,B
3. D,C,B,A
4. D,B,A,C

20. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට අනුව බෙදා දැක්වීමේ දී ප්‍රඥාවට අයත් අංග පමණක් ඇතුළත් වරණය තෝරන්න.
1. සම්මා දිට්ඨි හා සම්මා සංකප්ප ය.
2. සම්මා සමාධි හා සම්මා සති ය.
3. සම්මා කම්මන්ත හා සම්මා වචා ය.
4. සම්මා දිට්ඨි හා සම්මා ආජීව ය.

21. **"දියඇළවෝ දිය ගෙන යන්නාක් මෙන්"** යන ප්‍රකාශයෙහි නිවැරදි පාලි පාඨය ඇතුළත් වරණය වනුයේ,
1. දාරුං නමයන්ති තච්ඡකා
2. උසුකාරා නමයන්ති තේජනං
3. උදකං හි නයන්ති නෙත්තිකා
4. අත්තානං දමයන්ති පණ්ඩිතා

22. දස අසුභ කර්මස්ථාන අනුව **"පුලවක"** යන්නෙහි අදහස වන්නේ,
1. ලේ වැගිරෙන මළසිරුර ය.
2. සිදුරු වී ගිය මළසිරුර ය.
3. සැරව වැගිරෙන මළසිරුර ය.
4. පණුවන් වැහුණු මළසිරුර ය.

23. සංස්කාර හෙවත් රැස් වී එකතු වී සකස්වන ධර්මයන්ගේ ප්‍රධාන ලක්ෂණ ගණන වන්නේ,
1. පහකි.
2. හතකි.
3. හයකි.
4. තුනකි.

24. ෂට් ශාස්තෘන් අතරින් දස වස්තුක දෘෂ්ටිය තම ප්‍රධාන ඉගැන්වීම ලෙස ඉදිරිපත් කළේ,
1. සංජය බෙල්ලට්ඨිපුත්ත ය.
2. නිගණ්ඨනාථපුත්ත ය.
3. පකුධකච්චායන ය.
4. අජිතකේශකම්බල ය.

25. ප්‍රථම ධර්ම සංගායනාව ....................... රජගහනුවර වේභාර නම් පර්වත පාමුල සප්තපර්ණී ගුහාව අභියස සාදන ලද අලංකාර මණ්ඩපයෙහි පවත්වන ලදී.
1. තෙමසක් මුළුල්ලේ
2. සත්මසක් මුළුල්ලේ
3. සිව්මසක් මුළුල්ලේ
4. සයමසක් මුළුල්ලේ

26. **"කිරිත් නො වූ දීකිරිත් නො වූ කිරි අවේලාවෙහි වැළඳීම කැප ය."** යන අදහස දැක්වෙන දස අකැප වස්තු පාලි පදය ඇතුළත් වරණය වන්නේ,
1. අමථිතකප්ප
2. අනුමතිකප්ප
3. ජලෝගිකප්ප
4. ආවාසකප්ප

27. තෙවන ධර්ම සංගායනාවෙන් පසු නවරට සසුන් පිහිට වූ අතර, එහි වැඩම කළ මජ්ඣිම තෙරුන් වහන්සේ පළමු ව ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාව සිදු කරන ලද්දේ,
1. තම්බපණ්ණියේ ය.
2. හිමවන්තයේ ය.
3. ස්වර්ණභූමියේ ය.
4. මහිසමණ්ඩලයේ ය.

28. පැරණි සිංහල සංස්කෘතිය තුළ ගොවි ගැටලුවලට විසඳුම් සෙවීමේ දී විනිශ්චය ශාලාව වූයේ,
1. විශ්‍රාම ශාලාව යි.
2. උසාවි ශාලාව යි.
3. ධර්ම ශාලාව යි.
4. පාසල් ශාලාව යි.

29. කලා ශිල්ප රටක ................. ප්‍රෞඪත්වය විදහාපාන තවත් ප්‍රධාන ලක්ෂණයකි.
1. සංස්කෘතියේ
2. ජාතියේ
3. ආගමේ
4. මිනිසුන්ගේ

30. තමා විසින් ම මෙලොව දී ම අත්දැකිය හැකි හෙයින් ධර්මය,
1. සන්දිට්ඨික නම් වේ.
2. අකාලික නම් වේ.
3. පච්චත්තං වේදිතබ්බ නම් වේ.
4. ඒහි පස්සික නම් වේ.

31. සම්බුදු සසුනේ ධුතාංගධාරී ශ්‍රාවකයන් වහන්සේලා අතර අග්‍රස්ථානය ලැබුවේ,
1. සැරියුත් මහ රහතන් වහන්සේ ය.
2. මහා කච්චායන මහ රහතන් වහන්සේ ය.
3. මහා කාශ්‍යප මහ රහතන් වහනසේ ය.
4. රාධ මහ රහතන් වහන්සේ ය.

32. පිරිකර, ආරාමික භාණ්ඩ පරිහරණය පිළිබඳ නීති රීති ඇතුළත් වන්නේ මහාවග්ග පාලියේ,
1. මහාක්ඛන්ධකයෙහි ය.
2. කොසම්බක්ඛන්ධකයෙහි ය.
3. චීවරක්ඛන්ධකයෙහි ය.
4. චම්මක්ඛන්ධකයෙහි ය.

33. **උපසම්පදා** යන වචනය හා සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. සාමණේරයන් වහන්සේ නමක් විසි වයස් සම්පූර්ණ වීමෙන් උපසම්පදා විය යුතු ය.
2. සාමණේර බවින් ඔසවා සීලයේ උපරිම තත්ත්වයට පත්වීම උපසම්පදාව යි.
3. උපසම්පදාවෙන් පසු උභය ප්‍රාතිමෝක්ෂය ප්‍රගුණ කළ යුතු වේ.
4. ආර්ය මාර්ගය තුළ උපසම්පදා වීම අනිවාර්ය විනය කර්මයකි.

34. යම් භික්ෂුවක් **ආහුනෙය්‍යා, පාහුනෙය්‍යා, දක්ඛිණෙය්‍යා, අංජලිකරණීය** ආදි ධර්ම කරුණු සතකින් යුක්ත විය යුතු බව සඳහන් සූත්‍රයක් වන්නේ,
1. අං.නි. සාරාණීය සූත්‍රය යි.
2. අං.නි. ධම්මඤ්ඤූ සූත්‍රය යි.
3. ම.නි. මධුපිණ්ඩික සූත්‍රය යි.
4. ම.නි. භද්දාලි සූත්‍රය යි.

35. කුසල් සිත්වල හා අකුසල සිත්වල මිශ්‍ර ව යෙදෙන බැවින් ................ චෛතසික යනුවෙන් හඳුන්වනු ලැබේ.
1. පකිණ්ණක
2. අන්‍යසමාන
3. සබ්බ චිත්ත සාධාරණ
4. සෝභන

36. **"පුත්තාමත්ථි ධනම්මත්ථි..."** යන ගාථාව තථාගතයන් වහන්සේ විසින් දේශනා කරනු ලැබුවේ,
1. ආනන්ද සිටුවරයා මුල් කරගෙන ය.
2. අදින්න පුබ්බක මුල් කරගෙන ය.
3. කොසොල් මහ රජ මුල් කරගෙන ය.
4. සුමන මාලාකරු මුල් කරගෙන ය.

37. සත්තිස් බෝධිපාක්ෂික ධර්ම අතරින් පංචබල ධර්ම ඇතුළත් නිවැරදි වරණය වනුයේ,
1. ඡන්ද, චිත්ත, විරිය, වීමංසා, පඤ්ඤා
2. ආයු, වණ්ණ, සැප, බල, පඤ්ඤා
3. සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා
4. සද්ධා, සීල, චාග, සමාධි, පඤ්ඤා

38. ඕරම්භාගිය සංයෝජන ලෙස හඳුන්වනු ලබන්නේ,
1. සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ
2. රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා
3. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා
4. මෝහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච, විචිකිච්ඡා

39. පළමු ධර්ම සංගායනාවේ දී දීඝ නිකාය මුඛ පරම්පරාවෙන් ඉදිරියට පවත්වාගෙන යෑම භාර වූයේ,
1. සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පිරිසට ය.
2. අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ය.
3. ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ය.
4. මහාකාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ය.

40. ලංකා ජන සමාජය තුළ **"කුල දේවතා"** යන ගෞරව නාමයෙන් හඳුන්වනු ලබන්නේ,
1. භික්ෂුව ය.
2. දෙමාපියන් ය.
3. හමුදාව ය.
4. ගුරුවරුන් ය.

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - சிறப்புக் கல்விப் பிரிவு

| 03 | S | I |
|---|---|---|

පැය තුනයි

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2024

## 04 ශ්‍රේණිය

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## (03) ත්‍රිපිටක ධර්මය - II පත්‍රය

* I කොටසේ ප්‍රශ්නය ද, II සහ III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද, තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I - කොටස

**01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. ත්‍රිවිධ රත්නයේ රත්න භාවයට හේතු වන කරුණු හතරක් නම් කරන්න.

ii. චෛතසිකවල පොදු ලක්ෂණ හතර නම් කරන්න.

iii. විනය නීති පැනවීම සඳහා හේතු වූ ආසවට්ඨානීය ධර්ම හතර නම් කරන්න.

iv. සතර සංවර සීලය නම් කරන්න.

v. අකුසල චෛතසිකයන්ගෙන් හතරක් නම් කරන්න.

vi. සමසතළිස් කර්මස්ථානයන්හි එන දස අනුස්සති අතුරින් හතරක් නම් කරන්න.

vii. බුද්ධාදි අටතැන්හි සැක අතරින් හතරක් නම් කරන්න.

viii. දේවදත්ත තෙරුන්ගේ පඤ්ච වරයෙන් හතරක් ලියන්න.

ix. දස අකැප වස්තු අතරින් හතරක් නම් කරන්න.

x. සතර සම්‍යක් ප්‍රධාන වීර්ය නම් කරන්න.

(ලකුණු 2 x10 = 20)

### II - කොටස

**02.** i. දහම් ගුණ පිළිවෙළින් ලියන්න.

ii. ඔබ කැමති දහම් ගුණයක් විස්තර කරන්න.

**iii. "දහම් ගුණ මනා ව අවබෝධ කර ගැනීම තුළින් බුදුදහම පිළිබඳ අචල ශ්‍රද්ධාවක් ඇති වේ."** මෙය පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5=10)

**03.** i. පහත සඳහන් ගාථා අතරින් දෙකක් සම්පූර්ණ කරන්න.

i. වරං වේ නාධිගච්ඡෙය්‍යා...........

ii. පුත්තාමත්ථි ධනම්මත්ථි.........

iii. න භජෙ පාපකෙ මිත්තෙ........

iv. ධම්මපීති සුඛං සෙති.......

ii. සම්පූර්ණ කරන ලද එක් ගාථාවකට අදාළ නිදාන කතාව ලියන්න.

(ලකුණු 3+3+4=10)

**04**. i. ඕරම්භාගිය සංයෝජන හා උද්ධම්භාගිය සංයෝජන අතර වෙනස පහදන්න.

ii. අඤ්ඤා හි ලාභූපනිසා - අඤ්ඤා නිබ්බාණගාමිනී යන ධම්මපද ගාථා අර්ධයේ අදහස පැහැදිලි කරන්න.

iii. සත්ත්වයාට සසරින් ගැලවීමට සංයෝජන ධර්ම බාධා වන අයුරු නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5=10)

## III - කොටස

**05.** i. විනය කර්ම සිදු කරන සම්මත සීමා දෙකක් නම් කරන්න.

ii. උපසම්පදා විනය කර්මයේ ආරම්භය පිළිබඳ පැහැදිලි කරන්න.

iii. පරිපූර්ණ භික්ෂු චරිතයක් ගොඩනැගීම උදෙසා උපසම්පදාවේ වැදගත්කම පෙන්වා දෙන්න.

(ලකුණු 2+3+5=10)

**06.** i. නිධිකණ්ඩ සූත්‍රයෙහි සඳහන් නිධාන හතර නම් කරන්න.

ii. නිධානයක විපත්ති වළකන ආකාරය නිධිකණ්ඩ සූත්‍රයට අනුව පැහැදිලි කරන්න.

iii. දානානිසංස දේශනාවක් නිධිකණ්ඩ සූත්‍රය ඇසුරින් පිළියෙල කරන්න.

(ලකුණු 2+3+5=10)

**07.** i. අන්‍යසමාන චෛතසික බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

ii. චෛතසිකයන්හි පොදු ලක්ෂණ පිළිබඳ විස්තර කරන්න.

iii. අකුසල චෛතසික ඇති වීම මගින් පුද්ගලයාට සිදු වන අහිතකර බලපෑම විස්තර කරන්න.

(ලකුණු 2+3+5=10)

# ත්‍රිපිටක ධර්මය

## අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 4 ශ්‍රේණිය

# මූලික පිරිවෙන් අවසානවාර පරීක්ෂණය - 2018

# Primary Piriven Year End Test - 2018

## ශ්‍රේණිය 04/Grade 04

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ත්‍රිපිටක ධර්මය | කාලය : පැය තුනයි

Thripitaka Dharmaya | Time : Three Hours

ත්‍රිපිටක ධර්මය

I,II කොටස්වල ප්‍රශ්න සියල්ලට ම ද, III කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.

### I කොටස

01. නව අරහාදි බුදුගුණයන්ට අයත් නොවන්නේ මින් කුමක්ද?

i. සම්මා සම්බුද්ධ ගුණය ii. විජ්ජාචරණ බුදුගුණය iii. ලෝකවිදූ ගුණය iv. සන්දිට්ඨික ගුණය

02. අඤ්ජලිකරණීය යන්නට සමාන අර්ථය වන්නේ,

i. පරලොව සුවපතා දෙන දානය පිළිගැනීමට සුදුසු වීම.
ii. බැහැරින් පැමිණෙන නෑ හිත මිතුරන් උදෙසා වෙන් කළ ආගන්තුක සංග්‍රහ පවා පිළිගැනීමට සුදුසු බව
iii. දෑත් එක්තැන් කොට වැඳීමට ආචාර කිරීමට ගරු සරු කිරීමට සුදුසු බව
iv. ලෝකයාට දානාදි පින් බීජ වැපිරීමට සුදුසු උතුම් පින් කෙත වන බව

03. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ලැබූ අගතනතුර වන්නේ,

i. තෙළෙස් ධූතාංගධාරී භික්ෂූන් අතුරින් අගතනතුර
ii. ඍද්ධිමත් භික්ෂූන් අතර අගතනතුර
iii. ධර්මධර භික්ෂූන් අතර අගතනතුර
iv. විනයධර භික්ෂූන් අතර අගතනතුර

04. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් ඇති කළ විද්‍යාස්ථානය,

i. විද්‍යාලංකාර පිරිවෙන යි ii. විද්‍යෝදය පිරිවෙන යි
iii. පරම ධම්මචේතිය පිරිවෙන යි iv. විජයානන්ද පිරිවෙන යි

05. ආසවට්ඨානීය ධර්මයන්ට අයත් නොවන්නේ,

i. වේපුල්ල මහත්තතා
ii. ලාභග්ග මහත්තතා
iii. විනයානුග්ගහාය
iv. බාහුසච්ච මහත්තතා

06. ධම්මඤ්ඤූ සූත්‍රයෙහි මත්තඤ්ඤූ යන්නෙන් අර්ථවත් වන්නේ

i. යම් භික්ෂුවක් කෙසේ නම් ධර්මය දන්නේ වෙයි ද
ii. යම් භික්ෂුවක් කෙසේ නම් අර්ථය දන්නේ වෙයි ද
iii. යම් භික්ෂුවක් කෙසේ නම් තමා පිළිබඳ දන්නේ වෙයි ද
iv. යම් භික්ෂුවක් කෙසේ නම් පමණ දන්නේ වෙයි ද

07. අට්ඨවාචක උපසම්පදාව යනුවෙන් අදහස් වන්නේ,

i. ධර්ම කාරණා අටක් අසා පිළිතුරු ගැනීමෙන් පසුව ලැබෙන උපසම්පදාව
ii. ගරු ධර්ම අට පිළිගැනීමෙන් ලබන උපසම්පදාව
iii. බුදුරජාණන් වහන්සේ විසින් ම ලබාදුන් උපසම්පදාව
iv. ඤත්තියක් තබා සංඝ කර්ම වාක්‍ය කීමෙන් ලබන උපසම්පදාව

08. අභිධර්මයේ අකුසල චෛතසික ගණන,

i. දහතුනකි    ii. දහහතරකි    iii. දහනවයකි    iv. විසිපහකි

09. අභිධර්මයේ කුක්කුච්ච යන්නෙන් අර්ථවත් වන්නේ,

i. මසුරුකම යි    ii. සැකය යි    iii. විපිළිසර බව යි    iv. උද්ධච්චය යි

10. චතුධාතු ව්‍යවස්ථාන යනු,

i. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතු වෙන් කොට හඳුනා ගැනීම යි
ii. පඨවි, ආපෝ, තේජෝ, වායෝ අරමුණු කොට කමටහන් වැඩීම යි
iii. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතුවලට ස්වභාවික වස්තු බෙදීම යි
iv. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතු හතරට බෙදමින් යොනිසො මනසිකාරයෙන් බෙදීම යි

11. වරද පෙන්වීම, නිදානයක් දක්වීම හා සමාන වේ. යන අර්ථය ගැබ්ව පවතින ගාථාව වන්නේ,

i. ඔවදෙය්‍යානුසාසෙය්‍ය
ii. නිදීනං ව පවත්තාරං
iii. උදකංහි නයන්ති නෙත්තිකා
iv. අප්පකා තෙ මනුස්සේසු

12. බුද්දක නිකායේ ධම්ම පදයට අයත් ගාථා සංඛ්‍යාව,

i. හාරසිය විසි තුනකි
ii. හාරසිය විසි හතරකි
iii. හාරසිය විසි හයකි
iv. හාරසිය තිහකි

13. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රඥා ශික්ෂාවට වැටෙන අංග වන්නේ,

i. සම්මා වාචා, සම්මා කම්මන්ත
ii. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප
iii. සම්මා වායාම, සම්මා සති
iv. සම්මා දිට්ඨි, සම්මා සමාධි

14. දෙවන ධර්ම සංගායනාවට සහභාගී වූ මහරහතන් වහන්සේලා ගණන,

i. තුන්සියයකි    ii. පන්සියයකි    iii. හත්සියයකි    iv. දහසකි

15. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ධර්ම ප්‍රචාරය සඳහා මහිස මණ්ඩලයට වැඩම කළ ධර්ම දූත පිරිසට නායකත්වය ගත් මහරහතන් වහන්සේ,

i. රක්ඛිත මහරහතන් වහන්සේ ය
ii. මජ්ඣන්තික මහරහතන් වහන්සේ ය
iii. මිහිඳු මහරහතන් වහන්සේ ය
iv. මහාදේව මහරහතන් වහන්සේ ය

16. ප්‍රාග් බෞද්ධ යුගය යනුවෙන් අර්ථවත් වන්නේ,

i. බෞද්ධ යුගයට පෙර යුගය යි
ii. බෞද්ධ යුගයට පසු යුගය යි
iii. බෞද්ධ යුගයට සමකාලීන යුගය යි
iv. බෞද්ධ යුගයට අයත් යුගය යි

17. මිගාර මාතා යන අන්වර්ථ නාමයකින් හැඳින්වූයේ,

i. චූල සුභද්‍රා දේවිය යි ii. විශාඛා දේවිය යි iii. ප්‍රජාපති දේවිය යි iv. යසෝධරා දේවිය යි

18. අනගාරික ධර්මපාලතුමා ජන්ම ලාභය ලැබුවේ කිනම් වර්ෂයේ ද,

i. 1884 ii. 1874 iii. 1864 iv. 1854

19. නිධිකණ්ඩ සූත්‍රයට අනුව තමන් ඉගෙනගත් ශිල්ප ශාස්ත්‍ර අයත් වන්නේ,

i. ථාවර නිධානයට ය
ii. ජංගම නිධානයට ය
iii. අංගසම නිධානයට ය
iv. අනුගාමික නිධානයට ය

20. "යදනිච්චං තං දුක්ඛං" යනු,

i. යමක් අනිත්‍ය නම් එය දුක ය
ii. යමක් නිත්‍ය නම් එය දුක ය
iii. යමක් දුක නම් එය අනිත්‍ය ය
iv. යමක් අනාත්ම නම් එය දුක ය

(ලකුණු. 1x20 = 20)

## II කොටස

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

01. ධර්ම රත්නයේ ගුණ හයකි. ඉන් දෙකක් නම් කරන්න.

02. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සහ පටාචාරා රහත් තෙරණින් වහන්සේ ලත් අගතනතුරු මොනවා ද?

03. පතිකුලයට යන විශාඛාවන්ට පියතුමා දුන් අවවාද දහයෙන් දෙකක් ලියන්න.

04. විනය නීති පැනවීමේ අපේක්ෂා දහයකි. ඉන් දෙකක් ලියන්න.

05. පඨම සාරාණීය සූත්‍රයේ සඳහන් පැවිද්දන් විසින් නිතර සිහිකළ යුතු කරුණු දෙකක් නම් කරන්න.

06. එසො නිධි සුනිහිතො..... යන ගාථාව සම්පූර්ණ කරන්න.

07. අන්‍යසමාන චෛතසික බෙදෙන කොටස් දෙක නම් කරන්න.

08. නියාම ධර්ම දෙකක් නම කරන්න.

09. ෂඩ් ශාස්තෘවරුන්ගෙන් දෙදෙනෙක් නම් කරන්න.

10. තුන්වන ධර්ම සංගායනාවෙන් පසු මහිස මණ්ඩලයට හා කාශ්මීර ගාන්ධාරයට වැඩම කළ මහරහතන් වහන්සේලා නම් කරන්න.

(ලකුණු. 2x10 = 20)

## III කොටස

01. පහත සඳහන් ගාථා අතරින් දෙකක් සම්පූර්ණ කරන්න.

i. • න තං කම්මං කතං සාධු
   • උදකං හි නයන්ති නෙත්තිකා
   • ගතද්ධිනො විසොකස්ස
   • මධුවා මඤ්ඤති බාලො

ii. එම සම්පූර්ණ කළ ගාථා දෙකක අර්ථය ලියන්න.

iii. ඉන් එක් ගාථාවක නිදාන කතාව ලියන්න.

(ලකුණු. 6+4+5=15)

02. i. පළමු වන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා බලපෑ හේතු හතරක් ලියන්න.

ii. මහාසාංඝික නිකායට අයත් කොටස් පහක් නම් කරන්න.

iii. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ශාසනික උන්නතියට බලපෑ අයුරු විස්තර කරන්න.

(ලකුණු. 4+5+6=15)

03. i. භාවනා කර්මස්ථාන ප්‍රභේද දෙකක් නම් කරන්න.

ii. උද්ධුමාතක, විනීලක, විපුබ්බක, විච්ඡිද්දක, පුලවක යන පදවල අර්ථය සරල බසින් ලියන්න.

iii. ධම්මානුස්සති භාවනාව වඩන අයුරු විස්තර කරන්න.

(ලකුණු. 4+5+6=15)

04. i. උපසම්පදා යන්නෙහි වචනාර්ථය ලියන්න.

ii. උපසම්පදා නොකළ යුතු පුද්ගලයින් පස්දෙනෙකු නම් කරන්න.

iii. අකරණීය ධර්ම හෙවත් සතර පාරාජිකා පිළිබඳ ව විස්තර කරන්න.

(ලකුණු. 4+5+6=15)

05. i. ආර්ය සංඝ රත්නයේ ගුණ නම් කරන්න.

ii. ''භගවාති වචනං සෙට්ඨං'' යන ගාථාව සම්පූර්ණ කරන්න.

iii. උජුපටිපන්න සඟ ගුණය උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු. 5+4+6=15)

06. i. උපෝසථකරණයෙහි පුබ්බකරණ නම් කරන්න.

ii. උපෝසථ ප්‍රභේද නම් කර, කෙටියෙන් හඳුන්වන්න.

iii. උපෝසථ කර්ම කිරීමෙන් භික්ෂු සමාජය වඩාත් උසස් බවට පත්වේ. මෙම කියමන විස්තර කරන්න.

(ලකුණු. 4+5+6=15)

| | | |
|---|---|---|
| | **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019** | |
| | **Primary Piriven final Year Test - 2019** | |
| | 4 වසර / Grade 4 | |
| සියලු ම හිමිකම් ඇවිරිණි All Rights Reserved) | ත්‍රිපිටක ධර්මය **Thripitaka Dhamma** | කාලය : පැය තුනයි Time : Three hours |
| | විභාග අංකය : .................................... | |

I සහ II කොටස්වල ප්‍රශ්න සියල්ලටම ද III කොටසින් තෝරාගත් ප්‍රශ්න **සතරකට** ද පිළිතුරු ලියන්න.

## I කොටස

01. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. 'දුල්ලභ දස්සනං' යන්නෙහි නිවැරදි අර්ථය වන්නේ
   i. කිසිවක් සමාන නොවන බව  ii. කලාතුරකින් දක්නට ලැබෙන බව
   iii. උසස් පුද්ගලයින් විසින් පරිහරණය කරන බව  iv. ඉතා අගනා බව

2. ඉර මඬලත්, සඳමඬලත්, තථාගත ධර්මයත්, ආවරණය නොවී විවෘත ව තිබුණු තරමට බැබලෙන කාරණා තුනක් වන්නේ ය. මේ ප්‍රකාශය ඇතුළත් නිකාය ග්‍රන්ථය වන්නේ
   i. දීඝ නිකාය යි.  ii. මජ්ඣිම නිකාය යි.  iii. අංගුත්තර නිකාය යි.  iv. ඛුද්දක නිකාය යි.

3. තෙළෙස් ධූතාංග සමාදන් ව සත්දිනක් පුහුදුන් ව සිට අටවෙනි දින සිව්පිළිසිඹියාපත් මහරහතන් වහන්සේ නමකි.
   i. සැරියුත් මහරහතන් වහන්සේ  ii. අස්සජි මහරහතන් වහන්සේ
   iii. අනුරුද්ධ මහරහතන් වහන්සේ  iv. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ

4. ඇත පිටිසර පෙදෙසක ජලය කොළඹට ගෙනවුත් මහජනතාවට දෙවා ඔවුන්ගේ පිපාසා සංසිඳුවන බාහිර පවිත්‍රතාව ඇති කිරීමට මූලික ස්ථානය ලෙස මාලිගාකන්ද තෝරා ගත්තේ
   i. ගැගරී ආණ්ඩුකාරතුමා ය.  ii. දොන් කරෝලිස් හේවාවිතාරණ මුදලිතුමා ය.
   iii. දෝන පිළිප්පු සිල්වා ඇපා අප්පුහාමිතුමා ය.  iv. කාසිනාථ බමුණු පඬිතුමා ය.

5. දොන් බස්තියෙන් ද පවුලිස් ගුණවර්ධන හා මුණසිංහගේ පොඩිනෝනා යන පුණ්‍යවන්ත සැදැහැවත් දෙමවුපියන්ගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රරත්නය වූයේ
   i. හේන්පිටගෙදර ඥානසීහ හිමියන් ය.  ii. රේරුකානේ චන්දවිමල නාහිමියන් ය.
   iii. රත්මලානේ ධම්මාලෝක මාහිමියන් ය.  iv. හික්කඩුවේ සුමංගල නාහිමියන් ය.

6. සැවැත්නුවර මිගාර සිටුවරයා තම පූර්ණවර්ධන කුමරුට විවාහ කර දුන් කුමාරිකාව
   i. චූල සුභද්‍රාව ය.  ii. සුමනාව ය.  iii. සුජාතාව ය.  iv. විශාකාව ය.

7. 'ඤත්ති චතුත්ථකම්ම' උපසම්පදාව යන්නෙන් අදහස් කරන්නේ
   i. අෂ්ට ගරු ධර්ම පිළිගැනීමෙන් ලබන උපසම්පදාව
   ii. ඤත්තියක් සමග කර්ම වාක්‍ය කීමෙන් ලබන උපසම්පදාව
   iii. දූතයෙක් මාර්ගයෙන් යවන උපසම්පදාව
   iv. තිසරණ සමාදන් කරවීමෙන් ලබාදෙන උපසම්පදාව

8. 'යදනිච්චං තං දුක්ඛං' යන්නට වඩාත් නිවැරදි අර්ථය වන්නේ

i. යමක් අනාත්ම නම් එය දුක ය. ii. යමක් දුක නම් එය අනිත්‍ය ය.

iii. යමක් නිත්‍ය නම් එය දුක ය. iv. යමක් අනිත්‍ය නම් එය දුක ය.

9. 'සංඝයාගේ යහපත් බව පිණිස' යන්නෙහි නිවැරදි පාඨය වන්නේ

i. සංඝඵාසුතා ය ii. සංඝසුට්ඨුතාය iii. සද්ධම්මට්ඨිතියාය iv. විනයානුග්ගහාය

10. එක නමකට වැඩි සතර නමකට අඩු සංඛ්‍යාවේ සහභාගීත්වයෙන් කරන උපෝසථ කර්මයකි.

i. ගණ උපෝසථය ii. සංඝ උපෝසථය iii. පුග්ගල උපෝසථය iv. සාමග්ගි උපෝසථය

11. අංගුත්තර නිකායේ පඨම සාරාණීය සූත්‍රයේ භික්ෂූන් විසින් සිහිකටයුතු කරුණු කීය ද?

i. දහයකි ii. හයකි iii. හතකි iv. සතරකි

12. නිධිකණ්ඩ සූත්‍රයට අනුව ථාවර නිධානයක් වන්නේ

i. අඹුදරුවන්, දැසි දසුන්, ඇතුන්, යානවාහන ය.

ii. තමන් සතු රන් රුවන් කෙත්වතු, ඉඩකඩම් ය.

iii. තමන් ඉගෙනගත් ශාස්ත්‍ර හා ශිල්පයන් ය.

iv. තමන් විසින් කරගන්නා ලද පින්කම් ය.

13. තමා පිළිගත් දේ ම සත්‍යය අන් දේ අසත්‍යය යනුවෙන් අරමුණ වරදවා දකින ස්වභාවය

i. මානය යි ii. ලෝභය යි iii. දිට්ඨිය යි iv. මෝහය යි

14. සසර ගමන නිමා කළා වූ ශෝක ප්‍රහීණ කළා වූ යැයි යන අර්ථය සහිත ගාථා අර්ධය වනුයේ

i. ඕකමොකං ජහන්ති තේ ii. විමොක්ඛෝ යස්ස ගෝචරෝ

iii. සබ්බ ගන්ථප්පහීනස්ස iv. ගතද්ධිනෝ විසෝකස්ස

15. සිතෙහි පවත්නා ධර්ම අභාවයට යන්නට නොදී සුළු මොහොතක් හෝ ජීවත් කරවන්නේ

i. ඒකග්ගතා චෛතසිකයෙනි ii. මනසිකාර චෛතසිකයෙනි

iii. ජීවිතින්ද්‍රිය චෛතසිකයෙනි iv. පඤ්ඤා චෛතසිකයෙනි

16. නිර්වාණයෙහි ඇති ශාන්ත සුඛ ලක්ෂණය මෙනෙහි කිරීම

i. සීලානුස්සති භාවනාව යි ii. උපසමානුස්සති භාවනාව යි

iii. ධම්මානුස්සති භාවනාව යි iv. චාගානුස්සති භාවනාව යි

17. කයින් කෙරෙන අකුසල කර්ම සඳහන්ව ඇති නිවැරදි වර්ණය වන්නේ

i. ප්‍රාණඝාත, මුසාවාද, කාමමිථ්‍යාචාර

ii. ප්‍රාණඝාත, අදත්තාදාන, පිසුනාවාච

iii. ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර

iv. ප්‍රාණඝාත, මුසාවාද, මිථ්‍යාදෘෂ්ටි

18. බුදුන් දවස දඹදිව විසූ ෂට් ශාස්තෘවරුන් අතරින් නිගණ්ඨනාථපුත්‍රයන්ගේ ඉගැන්වීමේ ඇතුළත්ව ඇත්තේ

i. නියති වාදය, අහේතු අප්‍රත්‍යවාදය

ii. පරම අවිහිංසාවාදය, පුබ්බේකත හේතුවාදය

iii. සප්ත පදාර්ථවාදය, ශාස්වතවාදය

iv. අමරාවික්ඛේපවාදය, සංශයවාදය

19. දීඝනිකාය ආරක්ෂා කරගෙන යෑම සඳහා පණපනවන ලද භානක පරම්පරාව වනුයේ
   i. ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිස ය.
   ii. සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පිරිස ය.
   iii. මහාකාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිස ය.
   iv. අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිස ය.

20. කාශ්මීර් ගන්ධාර දේශයට වැඩම කළ තෙරුන් වහන්සේ හා එහි දී දේශනා කළ සූත්‍රය අයත් වන වර්ණය වන්නේ
   i. මහාදේව තෙරුන් හා දේවදූත සූත්‍රය
   ii. රක්ෂිත තෙරුන් හා අනමතග්ග සූත්‍රය
   iii. මහා ධම්මරක්ඛිත තෙරුන් හා මහා නාරද කස්සප ජාතකය
   iv. මජ්ඣන්තික තෙරුන් හා ආසිවිසෝපම සූත්‍රය

(ලකුණු 1x20=20)

## II කොටස

පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. සතර සතිපට්ඨාන ධර්ම නම් කරන්න.
2. **'විද්දෑ ණැන අට ද'** යන බුදු ගුණය ඇතුළත් කවිය සම්පූර්ණ කරන්න.
3. අනගාරික ධර්මපාලතුමන් ඇසුරු කළ යතිවරයාණන් වහන්සේලා දෙනමක් නම් කරන්න.
4. සතර පාරාජිකාපත්ති නම් කරන්න.
5. **මධුවා මඤ්ඤති බාලෝ - යාව පාපං න පච්චති** යන්නෙහි අර්ථය ලියන්න.
6. උපසම්පදා විනය කර්මය සිදු කෙරෙන ප්‍රධාන සීමා වර්ග දෙක නම් කරන්න.
7. සතර ආරුප්ප ධර්ම නම් කරන්න.
8. යෝගාවචරයාට බාධා පමුණුවන දස පළිබෝධයන්ගෙන් **කර්ම හා අද්ධාන** යන පළිබෝධ හඳුන්වන්න.
9. සංස්කාරයන්ගේ හෙවත් රැස්වී එකතු වී සකස් වන ධර්මයන්ගේ ප්‍රධාන ලක්ෂණ තුනකි. ඉන් දෙකක් නම් කරන්න.
10. මහාසාංඝික නිකාය නිසා ඇති වූ කොටස් පහක් ඇත. ඉන් දෙකක් නම් කරන්න.

(ලකුණු 2x10=20)

## III කොටස

1. i. **භගවාති වචනං සෙට්ඨං** යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii. බුදුරජාණන් වහන්සේගේ අනුත්තර පුරිසදම්මසාරථී බුදු ගුණය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

iii. සන්දිට්ඨිකෝ යන දහම් ගුණය විස්තර කරන්න.

(ලකුණු 4+5+6=15)

2. i. පහත සඳහන් ගාථා අතුරින් දෙකක් සම්පූර්ණ කරන්න.

- ගතද්ධිනෝ විසෝකස්ස ....
- ගාමේ වා යදි වාරඤ්ඤේ ....
- රමණීයානි අරඤ්ඤානි ....
- නතං කම්මං කතං සාධු ....

ii. එම සම්පූර්ණ කළ ගාථා දෙකෙහි අර්ථය ලියන්න.

iii. ඉන් එක ගාථාවක නිදාන කතාව ලියන්න.

(ලකුණු 4+5+6=15)

3. i. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයට අනුව ධනය නැසෙන දොරටු සතර නම් කරන්න.

ii. 'උට්ඨාන සම්පදාව'ට විවරණ සපයන්න.

iii. ව්‍යග්ඝපජ්ජ සූත්‍ර දේශනාව පුද්ගල ජීවිතයේ සාර්ථකත්වයට යොදාගත හැකි ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 4+4+7=15)

4. i. දස අකැප වස්තුවෙන් හතරක් නම් කරන්න.

ii. ප්‍රථම ධර්ම සංගායනාව සඳහා බලපෑ ආසන්නතම හේතුව සහ දුරස්ථ හේතු ලියා දක්වන්න.

iii. තුන්වැනි ධර්ම සංගායනාව පැවැත්වීමට හේතුව, සංගායනා කළ ස්ථානය, ප්‍රධානත්වය, සහභාගී වූ පිරිස, සංගායනා කළ දේ සහ ප්‍රතිඵල යන කරුණු පැහැදිලි වන සේ විස්තරයක් කරන්න.

(ලකුණු 4+5+6=15)

5. i. චෛතසික ධර්මයක ප්‍රධාන ලක්ෂණ හතර නම් කරන්න.

ii. සබ්බ චිත්ත සාධාරණ චෛතසික නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

iii. කුසල් කිරීමට චෛතසික බොහෝ සෙයින් උපකාරී වේ. එය සනාථ කිරීමට කුසල චෛතසික උපයෝගී කරගනිමින් විස්තරයක් කරන්න.

(ලකුණු 4+5+6=15)

6. අනගාරික ධර්මපාලතුමාගෙන් සිදු වූ ශාසනික හා ආධ්‍යාත්මික මෙහෙවර පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් කරන්න.

(ලකුණු 15)

7. i. දස අසුභයන්ගෙන් හතරක් නම් කරන්න.

ii. සද්ධා චරිතයාගේ ස්වභාවය පැහැදිලි කරන්න.

iii. ප්‍රඥාව ඇති කරන ත්‍රිලක්ෂණ දහම පිළිබඳ විස්තරයක් කරන්න.

(ලකුණු 4+5+6=15)

****

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020

Primary Piriven Year End Test - 2020

4 ශ්‍රේණිය / Grade 4

(සියලු ම හිමිකම් ඇවිරිණි)
(All Rights Reserved)

**ත්‍රිපිටක ධර්මය I** කාලය : පැය එක යි

**Thipitaka Dhamma I** **විභාග අංකය :-** ................ Time : One hours

**සැලකිය යුතු යි**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (i) (ii) (iii) (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40 ක් හිමි වේ.)
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ⓧ ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. ත්‍රිවිධ රත්නයේ රත්න භාවයට හේතුවන කරුණු පහකි. ඉන් **දුල්ලභ දස්සනං** යන්නෙන් හඳුන්වන්නේ,
(i) කිසිවක්ට සමාන නොවන බව යි.
(ii) කලාතුරකින් දක්නට ලැබෙන බව යි.
(iii) ඉතා අගනා බව යි.
(iv) උසස් පුද්ගලයන් විසින් පරිහරණය කරනු ලබන බව යි.

02. තමාට මෙලොව දී ම අත්දැකිය හැකි බැවින් ශ්‍රී සද්ධර්මය,
(i) අකාලික ය. (ii) ඒහිපස්සික ය. (iii) ඕපනයික ය. (iv) සන්දිට්ඨික ය.

03. පිදිය යුත්තන් පුදන ක්‍රම අතර **අංජලිකම්ම** යනුවෙන් අදහස් කරන්නේ,
(i) හිස මුදුනෙන් වැඳීම ය. (ii) හුනස්නෙන් නැඟී සිටීම ය.
(iii) දෑත් එක්කොට ආචාර දැක්වීම ය. (iv) වතාවත් කිරීම ය.

04. ආර්ය සංඝරත්නය **සාමීචි පටිපන්න** ලෙස හඳුන්වන්නේ,
(i) ධර්මවිනයෙහි ඇති අනුශාසනාවට පිළිපන් බැවිනි.
(ii) දුර සිට වුව ද ගෙනෙන සිව්පසය පිළිගැනීමට සුදුසු වන බැවිනි.
(iii) ආචාර සමාචාරයන්ට ස්වභාවයෙන් ම සුදුසු වන බැවිනි.
(iv) ඇප උපකාර ගනිමින් සතුටින් උතුම් මගට පිළිපන් බැවිනි.

05. මහා ශ්‍රාවක කාශ්‍යප මහරහතන් වහන්සේ සසුනේ ලද අග තනතුර වන්නේ,
(i) ධුතාංගධාරී ශ්‍රාවකයින් අතර අගතනතුර ය. (ii) ධර්ම භාණ්ඩාගාරික අගතනතුර ය.
(iii) විනයධර ශ්‍රාවකයින් අතර අගතනතුර ය. (iv) ඍද්ධිමත් භික්ෂූන් අතර අගතනතුර ය.

06. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් ආරම්භ කළ අධ්‍යාපන ආයතනය
(i) විද්‍යාලංකාර විද්‍යාස්ථානය යි.
(ii) ශ්‍රී සුමන පිරිවෙන් විද්‍යාස්ථානය යි.
(iii) පරමධම්මචේතිය විද්‍යාස්ථානය යි.
(iv) විද්‍යෝදය විද්‍යාස්ථානය යි.

07. විනය පැනවීමේ අපේක්ෂා දහයකි. එහි **සද්ධම්මට්ඨිති** යනුවෙන් දක්වා ඇත්තේ,
(i) සංඝයාගේ පහසුව පිණිස ය. (ii) සද්ධර්මයේ දිගුකාලීන පැවැත්ම පිණිස ය.
(iii) සාසනික ශික්ෂාවට අනුග්‍රහය පිණිස ය. (iv) සංඝයාගේ යහපත් බව පිණිස ය.

08. උපසම්පදා විනය කර්මයේ උපාධ්‍යායන් වහන්සේ හඳුන්වන්නේ,
(i) නාග නාමයෙනි. (ii) ආචරිය නාමයෙනි.
(iii) තිස්ස නාමයෙනි. (iv) ශ්‍රමණ නාමයෙනි.

09. **මහාලතා පසාදනය** හෙවත් මේල පළඳනාව දෙමාපියන්ගෙන් හිමි වූයේ,
(i) යශෝධරා දේවියට ය. (ii) සුභා දේවියට ය.
(iii) විශාකා සිටුදේවියට ය. (iv) මල්ලිකා සිටුදේවියට ය.

www.pirivena.lk

10. උපසම්පදා විනය කර්මයේ දී විමසනු ලබන අන්තරායකර ධර්මයක් වන **නසි රාජභටො** යනු,

(i) ණයෙන් මිදුනකු වීම යි. (ii) පාත්‍රා සිවුරු සම්පූර්ණ වීම යි.
(iii) දාසයකු නොවීම යි. (iv) රාජ භටයෙක් නොවීම යි.

11. සතරබ්‍රහ්මවිහාරයන්ට අයත් වන්නේ,

(i) සීල (ii) සමාධි (iii) උපේක්ඛා (iv) භාවනා

12. ධම්මඤ්ඤු සූත්‍රයට අනුව **අත්ථඤ්ඤු** යනුවෙන් හැඳින්වෙන්නේ,

(i) පමණ දන්නෙක් වීම යි. (ii) තමා පිළිබඳ දන්නෙක් වීම යි.
(iii) අර්ථය දන්නෙක් වීම යි. (iv) ධර්මය දන්නෙක් වීම යි.

13. අභිධර්මයේ චෛතසික කාණ්ඩයේ එන අන්‍යසමාන චෛතසික ගණනින්

(i) දහයකි. (ii) දොළහකි. (iii) දහහතරකි. (iv) දහතුනකි

14. නිධිකණ්ඩ සූත්‍රයට අනුව අනුගාමික නිධානයක් වන්නේ,

(i) තමන් සතු රන් රුවන් කෙත්වතු ය.
(ii) අඹු දරුවන් දැසි දසුන් ය.
(iii) තමන් ඉගෙනගත් ශාස්ත්‍ර හා ශිල්පයන් ය.
(iv) තමන් විසින් සිදු කර ගන්නා ලද දාන සීල භාවනා ආදි පින්කම් ය.

15. **අත්තානුවාද භය** යනුවෙන් හැඳින්වෙන්නේ,

(i) දුගතියට ඇති බිය යි. (ii) දඬුවමට ඇති බිය යි.
(iii) අනුන් තමාට දොස් නගිතියි ඇති බිය යි. (iv) තමාට තමා ම දොස් නගිතියි ඇති බිය යි.

16. පංච ඉන්ද්‍රිය ධර්මයක් නොවන්නේ,

(i) වීමංසාව යි. (ii) සද්ධාව යි. (iii) විරිය යි. (iv) සතිය යි.

17. බුදුරජාණන්වහන්සේ **සෙලොයථා ඒකඝනො** යන ගාථාව දේශනාකොට වදාළේ,

(i) සැරියුත් තෙරුන් උදෙසා ය.
(ii) මහාකප්පින තෙරුන් උදෙසා ය.
(iii) ලකුණ්ඨකභද්දිය තෙරුන් උදෙසා ය.
(iv) අස්සජි තෙරුන් උදෙසා ය.

18. දස අසුභ කර්මස්ථාන අනුව **විපුබ්බක** යන්නෙන් හැඳින්වෙන්නේ,

(i) ඉදිවීගිය මළසිරුර යි. (ii) ලේ වැගිරෙන මළසිරුර යි.
(iii) සැරව වැගිරෙන මළසිරුර යි. (iv) සිදුරු වී ගිය මළසිරුර යි.

19. අරහත් භාවයට පත්වනවිට සම්පූර්ණයෙන් ම දුරු වී යන සංයෝජනයන් නිවැරදි ව අයත් වරණය වන්නේ,

(i) රූපරාග, අරූපරාග, පටිඝ, උද්දච්ච, අවිජ්ජා
(ii) රූපරාග, අරූපරාග, කාමරාග, පටිඝ, අවිජ්ජා
(iii) රූපරාග, අරූපරාග, මාන, උද්දච්ච, අවිජ්ජා
(iv) රූපරාග, අරූපරාග, මාන, විචිකිච්ඡා, අවිජ්ජා

20. බුද්ධ කාලීන භාරතයේ **අකිරිය වාදය** හා **උච්ඡේද වාදය** යන ඉගැන්වීම් කළ ශාස්තෘවරයා වන්නේ,

(i) මක්ඛලීගෝසාල ය. (ii) පූර්ණ කස්සප ය. (iii) පකුධ කච්චායන ය. (iv) අජිත කේසකම්බල ය.

21. විනය පිටකයට ඇතුලත් උභතෝ විභංගය නිවැරදිව ඇතුළත්ව ඇති වරණය වන්නේ,

(i) පාරාජිකා පාළි, පාචිත්තිය පාළි (ii) පාරාජිකා පාළි, මහා වග්ග පාළි
(iii) පාරාජිකා පාළි, පරිවාර පාළි (iv) මහාවග්ගපාළි, චුල්ලවග්ග පාළි

22. තුන්වන ධර්ම සංගායනාවෙන් පසු මහිස මණ්ඩලයට වැඩම කළ තෙරුන් වහන්සේ හා දේශනාකල සූත්‍රය අයත් වරණය වන්නේ,

(i) රක්ඛිත තෙරුන් හා අනමතග්ග සූත්‍රය.
(ii) මහාරක්ඛිත තෙරුන් හා කාලාම සූත්‍රය.
(iii) මහාදේව තෙරුන් හා දේවදූත සූත්‍රය.
(iv) මහා ධම්මරක්ඛිත තෙරුන් හා මහා නාරද කස්සප ජාතකය

www.pirivena.lk

23. අභිධර්මයේ චෛතසික ධර්මයන්හි උගන්වන විරති චෛතසික අයත් වන්නේ,
(i) අකුසල චෛතසිකයන්ට ය. (ii) ශෝභන චෛතසිකයන්ට ය.
(iii) අන්‍යසමාන චෛතසිකයන්ට ය. (iv) ප්‍රකීර්ණක චෛතසිකයන්ට ය.

24. කාම රූප අරූප වශයෙන් සසර පැවත්මට ඇති ඇල්ම
(i) කාමාසව යි. (ii) දිට්ඨාසව යි. (iii) භවාසව යි. (iv) අවිජ්ජාසව යි.

25. සමාධි භාවනාවට යොමු වන යෝගාවචරයාට අහිතකර වන දස පළිබෝධ අතර **කර්ම** ලෙස දක්වන්නේ
(i) ආවාසය පිළිබඳ වගකීම් හෝ අපේක්ෂා තිබීම යි.
(ii) තමා හමුවට එන පිරිස් බහුල වීම යි.
(iii) නිදන්ගත රෝග බහුල කෙනෙකු වීම යි.
(iv) නව ඉදිකිරීම් අලුත්වැඩියා කිරීම් බහුල වීම යි.

26. බුද්ධ කාලීන ව පැවති ලෝකය පිළිබඳ ඉගැන්වීම් අතර සියල්ල ඉබේ පහළ වන්නේ ය යන අදහස ප්‍රකට කළේ,
(i) නිර්මාණවාදීන් ය. (ii) අධිච්ච සමුප්පන්නවාදීන් ය.
(iii) පුබ්බේකතහේතුවාදීන් ය. (iv) අහේතුකවාදීන් ය.

27. දස අකුසල කර්ම බෙදා දැක්වීමේ දී සිතින් සිදුවන අකුසල් ගණයට අයත් නොවන්නේ,
(i) සම්පප්‍රලාපය යි. (ii) අභිධ්‍යාව යි. (iii) ව්‍යාපාදය යි. (iv) මිථ්‍යාදෘෂ්ටිය යි.

28. සංස්කාරයන්ගේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ විග්‍රහයේ දී **වයෝ පඤ්ඤායති** ලෙස දැක්වෙන්නේ,
(i) සංස්කාරයන්ගේ හට ගැනීමක් ඇති බව යි.
(ii) සංස්කාරයන්ගේ තිබූ දෙය වෙනස් වීමක් ඇති බව යි.
(iii) සංස්කාරයන්ගේ දුක් සහගත ස්වභාවයක් ඇති බව යි.
(iv) සංස්කාරයන්ගේ නැසීමක් ඇති බව යි.

29. විචිකිච්චාව අංග අටකින් සමන්විත ය. එහි **පුබ්බන්තේ කංඛති** යනුවෙන් හඳුන්වන්නේ,
(i) සීලය ගැන සික්ෂා පද රැකීම ගැන සැක කරයි.
(ii) පෙර තමා ඉපිද සිටියේ දැයි සැක කරයි.
(iii) හේතුඵල දහම පිළිබඳ සැක කරයි.
(iv) නැවත පරලොව උපදී ය යන්න සැක කරයි.

30. බුද්ධ කාලීන ශ්‍රමණ සමාජයේ ප්‍රතිපත්තියක් වන්නේ,
(i) මහා බ්‍රහ්මයාගේ නිර්මාණවාදය පිළිගැනීම යි.
(ii) යාග හෝම පවත්වා දෙවියන්ට පූජා පැවැත්වීම යි.
(iii) විමුක්තිය පිණිස ඥාන මාර්ගය වැඩීම යි.
(iv) රජුන්ට අනුශාසනා කිරීම යි.

31. දෙවන ධර්ම සංගායනාවට හේතු වූ දස අකැප වස්තු අතර ගාමන්තර කප්ප ලෙස දක්වා ඇත්තේ,
(i) අඩක් වළඳා ඉතිරිය වෙනත් ගමකට ගොස් වැළඳීම කැප ය.
(ii) කිරිත් නොවූ දීකිරිත් නොවූ කිරි අවේලාවේ වැළඳීම කැප ය.
(iii) වාටියක් නොමැති අඳනය පරිහරණය කැප ය.
(iv) අඟක ලුණු තබා ගනිමින් ආහාරයට ගැනීම කැප ය.

32. ථෙරවාදී තෙවන ධර්ම සංගායනාව
(i) සහස්සිකා ලෙස හැඳින්වේ. (ii) පංචසතිකා ලෙස හැඳින්වේ.
(iii) සත්තසතිකා ලෙස හැඳින්වේ. (iv) ද්විසහස්සිකා ලෙස හැඳින්වේ.

33. දුකට පත් පුද්ගලයාට මෙලොව පමණක් නොව පරලොව දුකින් ද උපකාර කළ හැකි වේ නම් එය,
(i) මෙත්තා බ්‍රහ්ම විහරණය යි. (ii) කරුණා බ්‍රහ්ම විහරණය යි.
(iii) මුදිතා බ්‍රහ්ම විහරණය යි. (iv) උපේක්ෂා බ්‍රහ්ම විහරණය යි.

34. **සවේ මුනිසා මම පජා** යන අදහස සෙල්ලිපිවල පවා ලියා තබමින් එම අදහස අර්ථවත් කරමින් දේශය පාලනය කළේ,
(i) මහා ඇලෙක්සැන්ඩර් රජතුමා ය. (ii) මහා පරාක්‍රමබාහු රජතුමා ය.
(iii) දුටුගැමුණු රජ රජතුමා ය. (iv) ධර්මාශෝක රජතුමා ය.

www.piriyena.lk

35. උපෝසථාගාරයට රැස් වූ භික්ෂූන් වහන්සේලා පළමුවෙන් සිදු කළ යුතු කාර්යයන්ට (පුබ්බ කිච්ච) අයත් වන්නේ,

(i) පහන් දැල්වීම ය. (ii) භික්ෂූන් වහන්සේලා ගණන දැක්වීම ය.
(iii) පරිභෝග පැන් තැබීම ය. (iv) ආසන පැනවීම ය.

36. වර්තමාන පිරිත් දේශනා සම්ප්‍රදාය තුළ දොරකඩ අස්න හා අනුශාසනාව පවත්වන්නේ,

(i) තිස් පැයේ පිරිත් දේශනාවල දී ය. (ii) පැය හතේ පිරිත් දේශනාවල දී ය.
(iii) තිස්පැය පහේ පිරිත් දේශනාවල දී ය. (iv) තිස්පැය තුනේ පිරිත් දේශනාවල දී ය.

37. දුක්ඛ සංකල්පනාව ලොවට විෂය වන ආකාර තුනකි. ඉන් **සංඛාර දුක්ඛතා** ලෙස සැලකෙන්නේ,

(i) ජාති ජරා ආදියට පත්වෙමින් එදිනෙදා විඳින දුක යි.
(ii) මරණයට පත්වීම හේතු කොට ගෙන ඇති වෙන දුක යි.
(iii) රෝගීවීම මහලු වීම ආදී වෙනස්වීම් හේතු කොට ගෙන ඇති වෙන දුක යි.
(iv) පුනර්භවය පිළිබඳ ඇතිවෙන දුක යි.

38. දස සංයෝජන ධර්ම අතර සිත එක අරමුණක රඳවා තබා ගැනීමට අපහසු විසිර ගිය ස්වභාවය හඳුන්වා ඇත්තේ,

(i) විචිකිච්ඡා ලෙසිනි. (ii) කාමරාග ලෙසිනි.
(iii) රූපරාග ලෙසිනි. (iv) උද්ධච්ච ලෙසිනි.

39. සමථ භාවනාව සඳහා අරමුණු කර ගත හැකි කර්මස්ථාන ගණනින්

(i) විස්සකි. (ii) තිහකි. (iii) හතළිහකි. (iv) හතළිස් දෙකකි.

40. ධර්ම ශ්‍රවණය කිරීමේදී ඇසුණු සැණින් දහම අවබෝධ කර ගන්නා තැනැත්තා හැඳින්වෙන්නේ,

(i) උද්ඝටිතඤ්ඤූ ලෙසිනි. (ii) විපඤ්චිතඤ්ඤූ ලෙසිනි.
(iii) පදපරම ලෙසිනි. (iv) ඤෙය්‍ය ලෙසිනි.

*****

www.pirivena.lk

(සියලු ම හිමිකම් ඇවිරිණි)
(All Rights Reserved)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020

Primary Piriven Year End Test - 2020

4 ශ්‍රේණිය / Grade 4

| | | |
|---|---|---|
| ත්‍රිපිටක ධර්මය II | | කාලය : පැය තුනයි |
| **Thipitaka Dhamma** II | විභාග අංකය :- ……………. | Time : Three hours |

I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද II, III කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් ද තෝරා ගෙන ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

## I කොටස

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. දහම් ගුණ හයකි. ඉන් දෙකක් නම් කරන්න.

ii. රත්මලානේ ධම්මාලෝක නා හිමියන් රචනා කළ ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

iii. අනගාරික ධර්මපාල තුමාගේ මූලිකත්වයෙන් ආරම්භ කළ විහාර දෙකක් නම් කරන්න.

iv. භික්ෂු ප්‍රාතිමෝක්ෂයෙහි එන පාරාජිකා සතරෙන් දෙකක් ලියන්න.

v. **සම්මජ්ජනී පදීපෝ ච - උදකං ආසනේන ච** යන ගාථාව සම්පූර්ණ කරන්න.

vi. සබ්බ චිත්ත සාධාරණ චෛතසික දෙකක් ලියන්න.

vii. ත්‍රිපිටකයෙහි ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

viii. දුග්ගති භය සහ දණ්ඩ භය යන්නෙහි අර්ථ ලියන්න.

ix. දෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න.

x. ධම්මචක්ඛු සූත්‍රයට අනුව පුද්ගල චරිත හයකි. ඉන් දෙකක් ලියන්න.

(ලකුණු 2x10=20)

## II කොටස

2\. i. පහත සඳහන් ගාථා අතරින් එකක් සම්පූර්ණ කරන්න.

- නතං කම්මං කතං සාධු .....
- දීඝා ජාගරතෝ රත්තී .....
- න භජේ පාපකේ මිත්තේ .....
- ගතද්ධිනො විසොකස්ස .....

ii. එම සම්පූර්ණ කළ ගාථාවෙහි අර්ථය ලියන්න.

iii. එම ගාථාවට අදාළ නිදාන කතාව ලියන්න.

(ලකුණු 2+3+5=10)

3\. i. **අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං** යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii. **අකාලික** යන දහම් ගුණය පැහැදිලි කරන්න.

iii. මහා සංඝරත්නය සතු නවගුණයෙන් ඔබ කැමති ගුණයන් තුනක් පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් කරන්න.

(ලකුණු 2+3+5=10)

www.pirivena.lk

4. i. ව්‍යග්ගපජ්ජ සූත්‍රයට අනුව මෙලොව යහපතට හේතු වන කරුණු හතරෙන් දෙකක් නම් කරන්න.
ii. චාග සම්පදා යනු කුමක් දැ යි කෙටියෙන් පහදන්න.
iii. පඨම සාරාණීය සූත්‍රයේ සඳහන් සාරාණීය ධර්ම සහ ඒවා පුරුදු කිරීමෙන් භික්ෂුවකට ලැබිය හැකි ප්‍රයෝජන විස්තර කරන්න.

(ලකුණු 2+3+5=10)

## III කොටස

5. i. භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.
ii. ධම්මානුස්සති භාවනාව පිළිබඳ ව කෙටි පැහැදිලි කිරීමක් කරන්න.
iii. ප්‍රඥාව ඇති වන ආකාරය පිළිබඳ ත්‍රිලක්ෂණ දහම් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 2+3+5=10)

6. i. තෙවැනි සංගායනාව පැවැත්වීමට මූලික වූ කරුණු දෙකක් නම් කරන්න.
ii. දෙව්දත් තෙරුන්ගේ පංචවරය ලියන්න.
iii. පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට හේතුව, සංගායනා ස්ථානය, දායකත්වය, ප්‍රධානත්වය, පිරිස, සංගායනා කළ දේ හා ප්‍රතිඵල යන කරුණු ඇතුළත් වන සේ ප්‍රමාණවත් විස්තරයක් කරන්න.

(ලකුණු 2+3+5=10)

7. i. බුද්ධකාලීන පරමාදර්ශී බෞද්ධ උපාසක චරිත දෙකක් නම් කරන්න.
ii. රේරුකානේ චන්දවිමල නාහිමියන් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
iii. බුද්ධකාලීන ගිහි පැවිදි ශ්‍රාවක ශ්‍රාවිකා චරිතාදර්ශ වර්තමාන බෞද්ධ සමාජය ආකල්ප සම්පන්න සමාජයක් බවට පත්කිරීමට යොදා ගත හැකි අන්දම පහදන්න.

(ලකුණු 2+3+5=10)

8. i. **එකුප්පාද නිරෝධා ච** යන ගාථාව සම්පූර්ණ කරන්න.
ii. ප්‍රකීර්ණක චෛතසික පිළිවෙළින් නම් කරන්න.
iii. අකුසල් චෛතසිකයන්ගෙන් පිරුණු සිතක ස්වභාවය අකුසල් චෛතසික ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5=10)

*****

www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஉரிமையுடையது]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)
ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)
Year End Term Test – 2021 (2022)

පැ එකයි

**ත්‍රිපිටක ධර්මය - I** **4 ශ්‍රේණිය**

**සැලකිය යුතුයි.**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති (i) (ii) (iii) (iv) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40ක් හිමි වේ).**
- **ඔබට සැපයෙන බහුවරණ පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
- **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.**

01. ත්‍රිවිධ රත්නයේ රත්න භාවයට හේතු වන කරුණු පහකි. ඉන් **දුල්ලභදස්සනං** යන්නෙන් හඳුන්වන්නේ,
(i) කිසිවකට සමාන නොවන බව යි.
(ii) කලාතුරකින් දක්නට ලැබෙන බව යි.
(iii) ඉතා අගනා බව යි.
(iv) උසස් පුද්ගලයන් විසින් පරිහරණය කරනු ලබන බව යි.

02. බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ධර්මය තමාට මෙලොව දී ම අත්දැකිය හැකිය. එබැවින් ශ්‍රී සද්ධර්මය,
(i) අකාලික ය. (ii) එහිපස්සික ය. (iii) ඕපනයික ය. (iv) සංදිට්ඨික ය.

03. පිදිය යුත්තන් පුදන ක්‍රම අතර **"අංජලිකම්ම"** යනුවෙන් අදහස් කරන්නේ,
(i) හිස මුදුනෙන් වැඳීම ය. (ii) හුනස්නෙන් නැගී සිටීම ය.
(iii) දෑත් එක්කොට ආචාර දැක්වීම ය. (iv) වතාවත් කිරීම ය.

04. ආර්ය සංඝරත්නය **සාමීචි පටිපන්න** ලෙස හඳුන්වන්නේ,
(i) ධර්මවිනයෙහි ඇති අනුශාසනාවට පිළිපන් බැවිනි.
(ii) දුර සිට වුව ද ගෙනෙන සිව්පසය පිළිගැනීමට සුදුසු වන බැවිනි.
(iii) ආචාර සමාචාරයන්ට ස්වභාවයෙන් ම සුදුසු වන බැවිනි.
(iv) ඇප උපකාර කරගනිමින් සතුටින් උතුම් මගට පිළිපන් බැවිනි.

05. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ සසුනේ ලද අග තනතුර වන්නේ,
(i) ධුතාංගධාරී ශ්‍රාවකයින් අතර අගතනතුර ය. (ii) ධර්ම භාණ්ඩාගාරික අගතනතුර ය.
(iii) විනයධර ශ්‍රාවකයින් අතර අගතනතුර ය. (iv) ඍද්ධිමත් භික්ෂූන් අතර අගතනතුර ය.

06. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් ආරම්භ කළ අධ්‍යාපන ආයතනය වන්නේ,
(i) විද්‍යාලංකාර විද්‍යාස්ථානය යි. (ii) ශ්‍රී සුමන පිරිවෙන් විද්‍යාස්ථානය යි.
(iii) පරමධම්මචේතිය විද්‍යාස්ථානය යි. (iv) විද්‍යෝදය විද්‍යාස්ථානය යි.

07. විනය පැනවීමේ අපේක්ෂා දහයකි. එහි **සද්ධම්මට්ඨිතියා** යනුවෙන් දක්වා ඇත්තේ,
(i) සංඝයාගේ පහසුව පිණිස ය. (ii) සද්ධර්මයේ දිගුකාලීන පැවැත්ම පිණිස ය.
(iii) සාසනික ශික්ෂාවට අනුග්‍රහය පිණිස ය. (iv) සංඝයාගේ යහපත් බව පිණිස ය.

08. උපසම්පදා විනය කර්මයේ උපාධ්‍යායන් වහන්සේ හඳුන්වන්නේ,
(i) නාග නාමයෙනි. (ii) ආචරිය නාමයෙනි. (iii) තිස්ස නාමයෙනි. (iv) ශ්‍රමණ නාමයෙනි.

09. **මහාලතා පසාදනය** හෙවත් මේල පළඳනාව දෙමාපියන්ගෙන් හිමි වුයේ,
(i) යශෝධරා දේවියට ය. (ii) සුභා දේවියට ය.
(iii) විශාකා දේවියට ය. (iv) මල්ලිකා දේවියට ය.

10. උපසම්පදා විනය කර්මයේ දී විමසනු ලබන අන්තරායකර ධර්මයක් වන **"නසි රාජභටෝ"** යනු,
(i) ණයෙන් මිදුනකු වීම යි. (ii) පුරුෂයෙකු වීම යි.
(iii) දාසයකු නොවීම යි. (iv) රාජ භටයෙක් නොවීම යි.

11. සතර බ්‍රහ්මවිහරණයන්ට අයත් වන්නේ,
(i) සීලය යි. (ii) සමාධි යි. (iii) උපේක්ඛාව යි. (iv) භාවනාව යි.

12. ධම්මඤ්ඤු සුත්‍රයට අනුව **අත්තඤ්ඤු** යනුවෙන් හැඳින්වෙන්නේ,
(i) පමණ දන්නෙක් වීම යි. (ii) තමා පිළිබඳ දන්නෙක් වීම යි.
(iii) අර්ථය දන්නෙක් වීම යි. (iv) ධර්මය දන්නෙක් වීම යි.

13. අභිධර්මයට අයත් චෛතසික කාණ්ඩයේ එන අන්‍යසමාන චෛතසික ගණනින්
(i) දහයකි. (ii) දොළහකි. (iii) දහතුනකි. (iv) දාහතරකි.

14. නිධිකණ්ඩ සුත්‍රයට අනුව අනුගාමික නිධානයක් වන්නේ,
(i) තමන් සතු රන් රුවන් කෙත්වතු ය.
(ii) අඹුදරුවන් දැසි දසුන් ය.
(iii) තමන් ඉගෙනගත් ශිල්ප හා ශාස්ත්‍රයන් ය.
(iv) තමන් විසින් සිදු කර ගන්නා ලද දාන සීල භාවනා ආදී පින්කම් ය.

15. **"අත්තානුවාද භය"** යනුවෙන් හැඳින්වෙන්නේ,
(i) දුගතියට ඇති බිය යි. (ii) දඬුවමට ඇති බිය යි.
(iii) අනුන් තමාට දොස් නගිති යි ඇති බිය යි. (iv) තමාට තමා ම දොස් නගති යි ඇති බිය යි.

16. පංච ඉන්ද්‍රිය ධර්මයක් නොවන්නේ,
(i) වීමංසාව යි. (ii) සද්ධාව යි. (iii) විරිය යි. (iv) සතිය යි.

17. බුදුරජාණන්වහන්සේ "**සෙලෝ යථා ඒකඝනො**" යන ගාථාව දේශනාකොට වදාළේ,
(i) සැරියුත් තෙරුන් උදෙසා ය. (ii) මහාකප්පින තෙරුන් උදෙසා ය.
(iii) ලකුණ්ඨකභද්දිය තෙරුන් උදෙසා ය. (iv) අස්සජි තෙරුන් උදෙසා ය.

18. දස අසුභ කර්මස්ථාන අනුව **"විපුබ්බක"** යන්නෙන් හැඳින්වෙන්නේ,
(i) ඉදිමීගිය මළසිරුර යි. (ii) ලේ වැගිරෙන මළසිරුර යි.
(iii) සැරව වැගිරෙන මළසිරුර යි. (iv) සිදුරු වී ගිය මළසිරුර යි.

19. අරහත් භාවයට පත්වනවිට සම්පූර්ණයෙන් ම දුරු වී යන සංයෝජනයන් නිවැරදි ව දක්වා ඇති වරණය වන්නේ,
(i) රූපරාග , අරූපරාග , පටිඝ , උද්දච්ච , අවිජ්ජා
(ii) රූපරාග , අරූපරාග , කාමරාග , පටිඝ , අවිජ්ජා
(iii) රූපරාග , අරූපරාග , මාන , උද්දච්ච , අවිජ්ජා
(iv) රූපරාග , අරූපරාග , මාන , විචිකිච්ඡා , අවිජ්ජා

20. බුද්ධ කාලීන භාරතයේ **අකිරිය වාදය** හෙවත් **උච්ඡේද වාදය** ඉගැන්වීම් කළ ශාස්තෘවරයා වන්නේ,
(i) මක්ඛලීගෝසාල ය. (ii) පූර්ණ කස්සප ය.
(iii) පකුධ කච්චායන ය. (iv) අජිත කේසකම්බල ය.

21. විනය පිටකයේ සඳහන් **උභතෝ විභංගය** නිවැරදි ලෙස ඇතුළත් ව ඇති වරණය වන්නේ,

(i) පාරාජිකා පාලි , පාචිත්තිය පාලි (ii) පාරාජිකා පාලි , මහාවග්ග පාලි
(iii) පාරාජිකා පාලි , පරිවාර පාලි (iv) මහාවග්ග පාලි , චූල්ලවග්ග පාලි

22. තුන්වන ධර්ම සංගායනාවෙන් පසු මහිස මණ්ඩලයට වැඩම කළ තෙරුන් වහන්සේ හා දේශිත සූත්‍රය අයත් වරණය වන්නේ,

(i) රක්ඛිත තෙරුන් හා අනමතග්ග සූත්‍රය
(ii) මහාරක්ඛිත තෙරුන් හා කාලම සූත්‍රය
(iii) මහාදේව තෙරුන් හා දේවදූත සූත්‍රය
(iv) මහා ධම්මරක්ඛිත තෙරුන් හා මහා නාරද කස්සප ජාතකය

23. අභිධර්මයේ චෛතසික ධර්මයන් හි උගන්වන විරති චෛතසික අයත් වන්නේ,

(i) අකුසල චෛතසිකයන්ට ය. (ii) ශෝභන චෛතසිකයන්ට ය.
(iii) අන්‍යසමාන චෛතසිකයන්ට ය. (iv) ප්‍රකීර්ණක චෛතසිකයන්ට ය.

24. කාම, රූප, අරූප වශයෙන් සසර පැවැත්මට ඇති ඇල්ම,

(i) කාමාසාව යි. (ii) දිට්ඨාසාව යි. (iii) භවාසාව යි. (iv) අවිජ්ජාසාව යි.

25. සමාධි භාවනාවට යොමු වන යෝගාවචරයාට අහිතකර වන දස පළිබෝධ අතර **"කර්ම"** ලෙස දක්වන්නේ,

(i) ආවාසය පිළිබඳ වගකීම් හෝ අපේක්ෂා තිබීම යි. (ii) තමා හමුවට එන පිරිස් බහුල වීම යි.
(iii) නිදන්ගත රෝග බහුල කෙනෙකු වීම යි. (iv) නව ඉදිකිරීම් අලුත්වැඩියා කිරීම් බහුල වීමයි.

26. බුද්ධ කාලීන භාරතයේ පැවති ලෝකය පිළිබඳ ඉගැන්වීම් අතර **"සියල්ල ඉබේම පහළ වන්නේ ය"** යන අදහස ප්‍රකට කළේ,

(i) නිර්මාණවාදීන් ය. (ii) අධිච්ච සමුප්පන්නවාදීන් ය.
(iii) පුබ්බේකතහේතුවාදීන් ය. (iv) අහේතුකවාදීන් ය.

27. දස අකුසල කර්ම බෙදා දැක්වීමේ දී සිතින් සිදු වන අකුසල් ගණයට අයත් **නොවන්නේ,**

(i) සම්පප්‍රලාපය යි. (ii) අභිධ්‍යාව යි. (iii) ව්‍යාපාදය යි. (iv) මිත්‍යාදෘෂ්ටිය යි.

28. සංස්කාරයන්ගේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ විග්‍රහයේ දී **"වයෝ පඤ්ඤායති"** ලෙස දැක්වෙන්නේ,

(i) සංස්කාරයන්ගේ හට ගැනීමක් ඇති බව යි.
(ii) සංස්කාරයන්ගේ තිබූ දෙය වෙනස් වීමක් ඇති බව යි.
(iii) සංස්කාරයන්ගේ දුක් සහගත ස්වභාවයක් ඇති බව යි.
(iv) සංස්කාරයන්ගේ නැසීමක් ඇති බව යි.

29. විචිකිච්ඡාව අංග අටකින් සමන්විත ය. එහි **"පුබ්බන්තේ කංඛති"** යනුවෙන් හඳුන්වන්නේ,

(i) සීලය ගැන, සික්ෂා පද රැකීම ගැන සැක කරයි. (ii) පෙර තමා ඉපිද සිටියේ දැයි සැක කරයි.
(iii) හේතුඵල දහම පිළිබඳ සැක කරයි. (iv) නැවත පරලොව උපදී ය යන්න සැක කරයි.

30. බුද්ධ කාලීන ශ්‍රමණ සම්ප්‍රදායේ ප්‍රතිපත්තියක් වන්නේ,

(i) මහා බ්‍රහ්මයාගේ නිර්මාණවාදය පිළිගැනීම යි.
(ii) යාග හෝම පවත්වා දෙවියන්ට පූජා පැවැත්වීම යි.
(iii) විමුක්තිය පිණිස ඥාන මාර්ගය වැඩීම යි.
(iv) රජුන්ට අනුශාසනා කිරීම යි.

31. දෙවන ධර්ම සංගායනාවට හේතු වූ දස අකැප වස්තූන් අතර **"ගාමාන්තර කප්ප"** ලෙස දක්වා ඇත්තේ,

(i) වරක් වළඳා ඉතිරිය වෙනත් ගමකට ගොස් වැළඳීම කැප ය.
(ii) කිරිත් නොවූ දීකිරිත් නොවූ කිරි අවේලාවේ වැළඳීම කැප ය.
(iii) වාටියක් නොමැති අඳනය පරිහරණය කැප ය.
(iv) අඟක ලුණු තබා ගනිමින් ආහාරයට ගැනීම කැප ය.

32. බුදුසසුනේ චිර පැවැත්ම පිණිස ථෙරවාදීන් විසින් පවත්වන ලද තෙවන ධර්ම සංගායනාව,
(i) සාහස්සිකා ලෙස හැඳින්වේ. (ii) පංචසතිකා ලෙස හැඳින්වේ.
(iii) සත්තසතිකා ලෙස හැඳින්වේ. (iv) ද්විසහස්සිකා ලෙස හැඳින්වේ.

33. දුකට පත් පුද්ගලයා ට මෙලොව පමණක් නොව පරලොව දුකින් මිදීමට ද උපකාර කළ හැකි වේ නම් එය,
(i) මෙත්තා බ්‍රහ්ම විහරණය යි. (ii) කරුණා බ්‍රහ්ම විහරණය යි.
(iii) මුදිතා බ්‍රහ්ම විහරණය යි. (iv) උපේක්ෂා බ්‍රහ්ම විහරණය යි.

34. **''සබ්බේ මුනිසා මම පජා''** යන අදහස සෙල්ලිපිවල පවා ලියා තබමින් එම අදහස අර්ථවත් කරමින් දේශය පාලනය කළේ,
(i) කණිෂ්ක රජතුමා ය. (ii) මහා පරාක්‍රමබාහු රජතුමා ය.
(iii) දුටුගැමුණු රජතුමා ය. (iv) ධර්මාශෝක රජතුමා ය.

35. උපෝසථාගාරයට රැස් වූ භික්ෂූන් වහන්සේලා පළමුවෙන් සිදු කළ යුතු කාර්යයන්ට (පුබ්බ කිච්ච) අයත් **නොවන්නේ,**
(i) පහන් දැල්වීම ය. (ii) භික්ෂූන් වහන්සේලා ගණන දැක්වීම ය.
(iii) පරිභෝගයට පැන් තැබීම ය. (iv) ආසන පැනවීම ය.

36. වර්තමාන පිරිත් දේශනා සම්ප්‍රදාය තුළ දොරකඩ අස්න හා අනුශාසනාව පවත්වන්නේ,
(i) තිස් පැයේ පිරිත් දේශනාවල දී ය. (ii) තිස් පැය හතේ පිරිත් දේශනාවල දී ය.
(iii) තිස්පැය පහේ පිරිත් දේශනාවල දී ය. (iv) තිස්පැය තුනේ පිරිත් දේශනාවල දී ය.

37. දුක්ඛ සංකල්පනාව ලොවට විෂය වන ආකාර තුනකි. ඉන් **''සංඛාර දුක්ඛතා''** ලෙස සැලකෙන්නේ,
(i) ජාති ජරා ව්‍යාධියට පත්වෙමින් එදිනෙදා විඳින දුක යි.
(ii) මරණයට පත්වීම හේතු කොට ගෙන ඇති වන දුක යි.
(iii) රෝගීවීම මහලු වීම ආදී වෙනස්වීම් හේතු කොට ගෙන ඇති වන දුක යි.
(iv) පුනර්භවය පිළිබඳ ඇතිවෙන දුක යි.

38. දස සංයෝජන ධර්ම අතර සිත එක අරමුණක රඳවා තබා ගැනීමට අපහසු, විසිර ගිය ස්වභාවය හඳුන්වා ඇත්තේ,
(i) විචිකිච්ඡා ලෙසිනි. (ii) කාමරාග ලෙසිනි.
(iii) රූපරාග ලෙසිනි. (iv) උද්ධච්ච ලෙසිනි.

39. සමථ භාවනාව සඳහා අරමුණු කර ගත හැකි කර්මස්ථාන ගණනින්,
(i) විස්සකි. (ii) තිහකි. (iii) හතළිහකි. (iv) හතළිස් දෙකකි.

40. ධර්ම ශ්‍රවණය කිරීමේ දී ඇසුණු සැනින් දහම අවබෝධ කර ගන්නා තැනැත්තා හැඳින්වෙන්නේ,
(i) උද්ඝටිතඤ්ඤූ ලෙසිනි. (ii) විපචිතඤ්ඤූ ලෙසිනි.
(iii) නෙය්‍ය ලෙසිනි. (iv) පදපරම ලෙසිනි.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**

அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை

State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**

**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**

Year End Term Test – 2021 (2022)

පැය දෙකයි

**ත්‍රිපිටක ධර්මය - II** **4 වසර**

❖ **I කොටසේ ප්‍රශ්න සියල්ලටම ද II හා III කොටසේ වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

01. **පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(i). අෂ්ට විද්‍යාවන්ගෙන් හතරක් නම් කරන්න.

(ii). හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි විසින් රචනා කරන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(iii). උපසම්පදා විනය කර්ම අටෙන් හතරක් නම් කරන්න.

(iv). නවංග සත්ථු සාසනය තුළ අඩංගු අංග හතරක් ලියා දක්වන්න.

(v). නිධිකණ්ඩ සූත්‍රයේ එන නිධාන වර්ග සතර ලියා දක්වන්න.

(vi). මෝහ චෛතසිකයට අදාළ පාලි විග්‍රහ වාක්‍ය ලියන්න.

(vii). **"නිග්‍රහ කොට වරද පෙන්වන්නා වූ නුවනැත්තා ආශ්‍රය කරන්න. එවැනි උතුමන් ආශ්‍රය කරන්නාට යහපතක්වේ. අයහපතක් නොවේ"** මෙම ප්‍රකාශයට අයත් ධම්මපද ගාථාව ලියන්න.

(viii). රූපාවචර ධ්‍යාන හතරක් නම් කරන්න.

(ix). දස සංයෝජනයන්ගෙන් හතරක් නම් කරන්න.

(x). රේරුකානේ චන්දවිමල නාහිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ හතරක් නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

## II කොටස

02. (i). දහම් ගුණ කියැවෙන පාඨය නිවැරදි ව ලියන්න.

(ii). **"ඕපනයික"** ගුණය පැහැදිලි කරන්න.

(iii). **"දහම් ගුණ නිවැරදි ව අවබෝධ කරගැනීමෙන් අර්ථ සම්පන්න ධර්ම සන්නිවේදනයක් සිදුකළ හැකිය"** මෙම ප්‍රකාශය විමසන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03. (i). **"සේලො යථා ඒකඝනො"** යන ගාථාව සම්පූර්ණ කරන්න.

(ii). එම ගාථාවේ සිංහල අර්ථය නිවැරදි ව ලියන්න.

(iii). එම ගාථාවට අයත් නිදාන කථාව කෙටියෙන් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

04. (i). **"නිධිං නිධෙති පුරිසො"** යන නිධිකණ්ඩ සූත්‍රයේ එන ගාථාව සම්පූර්ණ කරන්න.

(ii). භෞතික නිදානයක ඇති ලක්ෂණ පහක් පිළිබඳ ව විස්තර කරන්න.

(iii). ලෞකික සැපය මෙන් ම ලෝකෝත්තර සැපය ලැබීමට ද පින උපකාර වන බව නිධිකණ්ඩ සූත්‍රය ඇසුරින් විමසන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

## II කොටස

05. (i). උපසම්පදා භික්ෂුවකගේ පැවිද්ද අහිමි වන සතර පාරාජිකා නම් කරන්න.

(ii). උපසම්පදා විනය කර්මය සිදුකරන ආකාරය කෙටියෙන් දක්වන්න.

(iii). පිරිපුන් භික්ෂු ජීවිතයකට උපසම්පදාවේ ඇති උපයෝගිතාව විමසන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06. (i). සසුන එකළු කළ නූතන භික්ෂූන් වහන්සේලා හතර නමක් නම් කරන්න.

(ii). හේන්පිටගෙදර ඥාණසීහ නාහිමි පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii). **'පරිහානියට පත් සමාජයක් ධර්ම ශාස්ත්‍රාලෝකයෙන් බැබළවීමට නම් තමන් පළමුව ධර්මයෙන් හා ශාස්ත්‍රයෙන් පරිණත කෙනෙකු විය යුතුය'** හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි චරිතාදර්ශ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. (i). **"මොහො අහිරිකං අනොත්තප්පං"** යන අභිධර්ම පාඨය සම්පූර්ණ කරන්න.

(ii). අකුසල චෛතසික දාහතරකි. ඉන් ඔබ කැමති දෙකක් පැහැදිලි කරන්න.

(iil). දස සංයෝජන අතරින් **"සීලබ්බත පරාමාස"** සංයෝජනය යන්න ධර්මානුකූල ව පහදන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விக் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය** - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை – 2022 (2023)
Year End Term Test – 2022 (2023)

**පැය එකයි**

**ත්‍රිපිටක ධර්මය - I** **4 ශ්‍රේණිය**

**සැලකිය යුතුයි :**

- ❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- ❖ අංක **01** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
- ❖ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

01. තථාගතයන් වහන්සේ සියලු සත්ත්වයන්ගේ ආසය හා අනුසය දක්නා ඥානයෙන් යුක්ත වේ. එබැවින්,
    i. විජ්ජාචරණ නම් වන සේක.
    ii. සුගත නම් වන සේක.
    iii. ලෝකවිදූ නම් වන සේක.
    iv. අරහං නම් වන සේක.

02. ශ්‍රී සද්ධර්මයේ උතුම් ගුණ අතර "**ඕපනයික**" යන්නෙන් අදහස් වන්නේ,
    i. තමා විසින් ම අවබෝධ කරගත යුතු බව ය.
    ii. තමාට මෙලොව දී ම අද්දැකිය හැකි බව ය.
    iii. මාර්ගඵල ධර්ම ප්‍රත්‍යක්ෂ කිරීමෙන් නිර්වාණයට ම පමුණුවන බව ය.
    iv. එව බලව යැ යි විවෘත ව කිව හැකි බව ය.

03. අෂ්ටාර්ය පුද්ගල මහා සංඝරත්නය "**පාහුනෙය්‍ය**" ගුණයෙන් යුක්ත ය. එහි අදහස ඇතුළත් වරණය වන්නේ,
    i. පරලොව සුව පතා දෙන දානය පිළිගැනීමට සුදුසු බව ය.
    ii. දුර බැහැර සිට ගෙනවුත් පුදන සිවුපසය පිළිගැනීමට සුදුසු බව ය.
    iii. නෑදෑ හිත මිතුරන් උදෙසා වෙන් කළ ආගන්තුක සත්කාර පවා පිළිගැනීමට සුදුසු බව ය.
    iv. ලෝකයාට උතුම් පින් කෙතක් වන බව ය.

04. පුනර්භවය හෙවත් නැවත ඉපදීම ඇති කරවන, නන්දිරාගය හෙවත් සතුටුවීමෙන් ඇලීම ඇති කරන, රූපාදි අරමුණෙහි ඇලෙන තෘෂ්ණාව හැඳින්වෙන්නේ,
    i. ව්‍යාපාද කායගන්ථ ලෙස යි.
    ii. අභිජ්ඣා කායගන්ථ ලෙස යි.
    iii. සීලබ්බත පරාමාස කායගන්ථ ලෙස යි.
    iv. ඉදං සච්චාභිනිවෙස කායගන්ථ ලෙස යි.

05. බුදුරජාණන් වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් යුක්ත වූවා සේ ම, මහා පුරුෂ ලක්ෂණ හතකින් යුක්ත වූ මහ රහතන් වහන්සේ වනුයේ,

i. සැරියුත් තෙරුන් ය. ii. මුගලන් තෙරුන් ය.
iii. මහාකාශ්‍යප තෙරුන් ය. iv. කුමාරකාශ්‍යප තෙරුන් ය.

06. **''මහා පැරකුම්බා සිරිත''** නම් කෘතිය රචනා කරන ලද්දේ,

i. රේරුකානේ චන්දවිමල නාහිමියන් ය. ii. හේන්පිටගෙදර ඤාණසීහ නාහිමියන් ය.
iii. රත්මලානේ ධර්මාලෝක නාහිමියන් ය. iv. හික්කඩුවේ සුමංගල නාහිමියන් ය.

07. පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයේ දී, එක්තරා භික්ෂුණියක් විනයධර භික්ෂුණීන් අතර අග්‍රස්ථානයෙහි පිහිටුවනු දැක **''මම ද මතු යම් බුදුවරයෙකු සමීපයෙහි එම තනතුර ලබන්නෙමි'' යැ යි සිතුවේ,**

i. උප්පලවණ්ණා තෙරණිය යි. ii. පටාචාරා තෙරණිය යි.
iii. යශෝධරා තෙරණිය යි. iv. මහා ප්‍රජාපතිගෝතමී තෙරණිය යි.

08. **''සම්බුදු සසුන බේරා ගැනීමට, තවත් විසිපස් වතාවක් මේ දඹදිව ඉපදේවා'' යැ යි** ප්‍රාර්ථනා කරනු ලැබුවේ,

i. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ය. ii. කරෝලිස් හේවාවිතාරණතුමා ය.
iii. එඩ්මන් හේවාවිතාරණතුමා ය. iv. අනගාරික ධර්මපාලතුමා ය.

09. භික්ෂු ප්‍රාතිමෝක්ෂයට අයත් **''සතර පාටිදේසනීය''** හා **''සප්ත අධිකරණ සමථ''** ඇතුළත් වන්නේ,

i. පාරාජික පාළියේ ය. ii. පාචිත්තිය පාළියේ ය.
iii. මහාවග්ග පාළියේ ය. iv. චුල්ලවග්ග පාළියේ ය.

10. සෝපාක සාමණේරයන් වහන්සේ .................................. උපසම්පදාව ලැබූහ.

i. ඕවාද පටිගහණයෙන් ii. සරණාගමනයෙන්
iii. පඤ්හව්‍යාකරණයෙන් iv. ඒහි භික්ඛු පැවිද්දෙන්

11. වස් සමාදන් වූ භික්ෂූන් වහන්සේලාට වැසිසළු පූජා කිරීමට අනුමැතිය හිමි වූයේ,

i. මහාප්‍රජාපතී ගෝතමී දේවියගේ ඉල්ලීමකට අනුව ය.
ii. ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීමකට අනුව ය.
iii. අනේපිඬු සිටුතුමාගේ ඉල්ලීමකට අනුව ය.
iv. විශාඛා සිටු දේවියගේ ඉල්ලීමකට අනුව ය.

12. අලෝභයෙන් ලෝභය, අදෝසයෙන් දෝසය, අමෝහයෙන් මෝහය යනාදි වශයෙන්, එක් එක් කුසලාංගයකින් අකුසලය යටපත් කොට කෙලෙසුන්ගෙන් මිදීම .................... යනුවෙන් හැඳින් වේ.

i. වික්ඛම්භන විමුක්තිය ii. සමුච්ඡේද විමුක්තිය
iii. තදංග විමුක්තිය iv. නිස්සරණ විමුක්තිය

13. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් විසින් රචිත ග්‍රන්ථ ඇතුළත් වරණය වන්නේ,

i. සද්ධර්මසතකම් , බන්ධකවිනය , රූපා
ii. බ්‍රාහ්මණ ධර්මය , මාසර්තු ලක්ෂණය , සීමා විභාගය
iii. පොහොය දිනය , ධර්ම විනිශ්චය , සූවිසි විවරණය
iv. රාජචරිතය , විනය කතිකාවත , සත්‍යවිලාසිනී

14. භික්ෂූන් වහන්සේලා උපෝසථාගාරයට රැස්වීමට පෙර කළ යුතු කාර්යයන් පුබ්බකරණ නම් වේ. ඒවාට අයත් **නො වන්නේ,**

i. උපෝසථාගාරය ඇමදීම යි. ii. පහන් දැල්වීම යි.
iii. දානය පිළියෙල කිරීම යි. iv. අසුන් පැනවීම යි.

15. උපසම්පදා අපේක්ෂක භික්ෂූන් වහන්සේ, උපසම්පදා විනය කර්මය අවසන් වන තුරු ම හඳුන්වනු ලබන්නේ,

i. තිස්ස නමින් ය. ii. නාග නමින් ය.
iii. සාමණේර නමින් ය. iv. ගණ නමින් ය.

16. ධම්මඤ්ඤූ සූත්‍රයට අනුව ''**කාලඤ්ඤූ**'' යනුවෙන් අදහස් වන්නේ,

i. පමණ ගැන දැන ගැනීම යි. ii. කාලය ගැන දැන ගැනීම යි.
iii. අර්ථය ගැන දැන ගැනීම යි. iv. ධර්මය ගැන දැන ගැනීම යි.

17. චෛතසික ධර්මවල පොදු ලක්ෂණ හතරකි. ඒ අතරින් ''**ඒකාලම්බන**'' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

i. සිත සමඟ ම ඉපදීම යි.
ii. සිත ගත් අරමුණ ම ගැනීම යි.
iii. සිත සමඟ ම නැතිව යාම යි.
iv. සිත ඒ අවස්ථාවේ ඇසුරු කරන වස්තුව ම ඇසුරු කිරීම යි.

18. පහත A කොටසෙහි සඳහන් පාලි පදවලට ගැළපෙන අර්ථ B කොටසෙහි ඇතුළත් වේ. A කොටසෙහි පාලි පදවල පිළිවෙළට අනුව, B කොටසෙහි නිවැරදි අක්ෂර පිළිවෙළ සහිත වරණය තෝරන්න.

| **A කොටස** | **B කොටස** |
|---|---|
| i. චිත්තීකතං | A. කිසිවකට සමාන නො වන බව |
| ii. මහග්ගං | B. ඉතා අගනා බව |
| iii. අතුලං | C. විසිතුරු බව |
| iv. දුල්ලබ දස්සනං | D. කලාතුරකින් දක්නට ලැබෙන බව |

i. B , A , C , D ii. C , A , B , D iii. A , B , C , D iv. C , B , A , D

19. ධනය නැසෙන දොරටු අතර **''සුරාධුත්තො හොති''** යන්නෙන් අදහස් වන්නේ,

i. ස්ත්‍රී ලෝලියෙකු වීම යි. ii. සුරා ලෝලියෙකු වීම යි.

iii. සූදු ලෝලියෙකු වීම යි. iv. පාපමිත්‍රයන් ඇසුරු කරන්නෙකු වීම යි.

20. අකුසල චෛතසික ගණයට අයත් **නො වන වරණය වන්නේ**,

i. ලෝභ චෛතසිකය යි. ii. හිරි චෛතසිකය යි.

iii. මෝහ චෛසිකය යි. iv. ඉස්සා චෛතසිකය යි.

21. **ද්වේෂ චරිත ස්භාවයක් ඇති** යෝගාවචරයාට වඩාත් ගැළපෙන කමටහන ඇතුළත් වරණය වන්නේ,

i. බ්‍රහ්මවිහාර සතර , වර්ණ කසිණ සතර ii. දස අසුභය , කායගතාසතිය

iii. මරණානුස්සතිය , ධාතුමනසිකාරය iv. දේවතානුස්සතිය , බුද්ධානුස්සතිය

22. සාර්ථක විවාහ දිවියක් ගත කිරීම සඳහා, සරණමංගල්‍යයට පෙර දින ධනංජය සිටුතුමා තම දියණිය වූ ...................... අවවාද දහයක් දුන්නේ ය.

i. විශාකාට ii. චූල සුභද්‍රාට iii. සුමනාට iv. මල්ලිකාට

23. බාලයෙකුගේ ලක්‍ෂණ අතරින්, **''දුබ්බාසිත''** යනුවෙන් සඳහන් වන්නේ,

i. නරක සිතුවිලි සිතන්නෙකි. ii. නරක වචන කතා කරන්නෙකි.

iii. නරක පවිටු ක්‍රියා කරන්නෙකි. iv. නරක හැසිරීම් ඇත්තෙකි.

24. ජලය අරමුණු කරගෙන වඩන භාවනාව හැඳින්වෙන්නේ,

i. තේජෝ කසින නමින් ය. ii. ආපෝ කසින නමින් ය.

iii. වායෝ කසින නමින් ය. iv. පඨවි කසින නමින් ය.

25. පංචනීවරණ ධර්මයන්හි එන **''ථිනමිද්ධ''** යන්නෙහි අර්ථය වන්නේ,

i. චෛතසිකයන්ගේ හා කයෙහි මැළි ගතිය යි. ii. සිත හා කයෙහි මැළි ගතිය යි.

iii. සිතෙහි හා චෛතසිකයන්ගේ මැළි ගතිය යි. iv. සිතෙහි, කයෙහි හා වචනයෙහි මැළි ගතිය යි.

26. පඨම සාරාණීය සූත්‍රයේ එන **''අප්පටිවිභත්තභොගී''** යන පදයෙහි අදහස වන්නේ,

i. සිව්පසය විශේෂයක් කොට පරිභෝජනය කිරීම යි.

ii. සිව්පසය නො බෙදා පරිභෝජනය කිරීම යි.

iii. සිව්පසය තෝරා ගෙන පරිභෝජනය කිරීම යි.

iv. සිව්පසය විශේෂයක් නො කර තෝරා නො බෙදා පරිභෝජනය කිරීම යි.

27. **''ශෝභන සාධාරණ චෛතසික''** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

i. සද්ධා , ලෝභ , හිරි , ඉස්සා ii. හිරි , අලෝභ , අදෝස , සති

iii. හිරි , සද්ධා , මෝහ , කරුණා iv. ඔත්තප්ප , ලෝභ , ඉස්සා , මච්චරිය

28. සමාධි භාවනාව සඳහා යොමු වන යෝගාවචරයාට අහිතකර වන පළිබෝධ දහයට අයත් ''**නිතර නිතර ගමන් බිමන් යාමට පුරුදු වීම**'' හැඳින්වෙන්නේ,

i. ගණ යනුවෙනි. ii. ලාභ යනුවෙනි.

iii. අද්ධාන යනුවෙනි. iv. කුල යනුවෙනි.

29. ''**සත්ත්වයා දිගු කලක් සසර සැරිසරන්නේ, චතුරාර්ය සත්‍යය අවබෝධ නො කිරීම නිසා ය.**'' මෙම බුද්ධ වචනය ඇතුළත් සූත්‍රය වන්නේ,

i. අවිජ්ජා සූත්‍රය යි. ii. පරිඤ්ඤෙය්‍ය සූත්‍රය යි.

iii. සිංසපා සූත්‍රය යි. iv. කෝටිගාම සූත්‍රය යි.

30. නිධිකණ්ඩ සූත්‍රයේ සඳහන් පරිදි තමන් සතු ''**අඹුදරුවන් , දැසි දසුන් , ඇතුන් , අසුන් , ගවයන් හෝ යාන වාහන**'' ආදිය ගමන් කරන හෝ තැන තැන ගෙන යා හැකි බැවින්, ඒවා හැඳින්වෙන්නේ,

i. ජංගම නිධාන නමින් ය. ii. ථාවර නිධාන නමින් ය.

iii. අංගසම නිධාන නමින් ය. iv. අනුගාමික නිධාන නමින් ය.

31. ''**චේතනාහං භික්ඛවේ කම්මං වදාමි, චේතයිත්වා කම්මං කරෝති, කායේන වාචාය මනසා**'' යන පාඨය ඇතුළත් සූත්‍රය වන්නේ,

i. චුල්ලකම්මවිභංග සූත්‍රය යි. ii. චූලසකුළුදායි සූත්‍රය යි.

iii. නිබ්බේධික සූත්‍රය යි. iv. මහානිදාන සූත්‍රය යි.

32. සත්ත්වයා සසරට ඇද බැඳ තබන දස සංයෝජන ධර්ම අතරින් ''**සීලබ්බතපරාමාස**'' යනුවෙන් හැඳින්වෙන්නේ,

i. වැරදි ශීල ව්‍රත අනුගමනය කිරීම යි. ii. සීලය ආරක්‍ෂා කිරීම යි.

iii. සීලයෙන් තොරව කටයුතු කිරීම යි. iv. සීලයට අනුව තම ජීවිතය සකස් කර ගැනීම යි.

33. පුද්ගලයෙකු සෝවාන් ඵලයට පත්වීමේ දී නැසිය යුතු සංයෝජන ධර්ම ඇතුළත් වරණය තෝරන්න.

i. සක්කායදිට්ඨි , කාමරාග , පටිඝ ii. විචිකිච්ඡා , මාන , රූපරාග

iii. සක්කායදිට්ඨි , විචිකිච්ඡා , සීලබ්බතපරාමාස iv. සක්කායදිට්ඨි , විචිකිච්ඡා , මාන

34. ෂට් ශාස්තෘවරුන් අතරින් ''**අමරාවික්ෂේපවාදය**'' ඉදිරිපත් කළේ,

i. පකුධ කච්චායන යි. ii. නිගණ්ඨනාථපුත්ත යි.

iii. අජිත කේශකම්බල යි. iv. සංජයබෙල්ලට්ඨිපුත්ත යි.

35. තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස, ධර්මාශෝක රජු නවරට සසුන් පිහිටුවීය. ඒ අනුව **කාශ්මීර ගාන්ධාර දේශයට** වැඩම කළේ,

i. මජ්ඣන්තික තෙරුන් වහන්සේ ය. ii. මහාදේව තෙරුන් වහන්සේ ය.

iii. රක්ඛිත තෙරුන් වහන්සේ ය. iv. මජ්ඣිම තෙරුන් වහන්සේ ය.

36. මෞර්ය අධිරාජ්‍ය වංශයේ ආරම්භක පාලකයා වූයේ,

i. බින්දුසාර රජු ය. ii. අශෝක රජු ය. iii. චන්ද්‍රගුප්ත රජු ය. iv. කාලාශෝක රජු ය.

37. සාම්ප්‍රදායිකව පවත්වනු ලබන පිරිත් දේශනා අතරින්, පස්වරු 6.00 සිට පෙරවරු 6.00 දක්වා කාලය තුළ දේශනා කරනු ලබන්නේ,

i. වරු පිරිත යි. ii. තුන්වරු පිරිත යි.

iii. තිස්පැයේ පිරිත යි. iv. තිස්පැය තුනේ පිරිත යි.

38. සද්ධර්මයේ ආරක්ෂාව හා චිර පැවැත්ම උදෙසා ධර්ම, විනය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාමට භික්ෂු පිරිසට භාර විය. ඒ අනුව **සංයුත්තනිකාය** භාර වූයේ,

i. ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ය. ii. අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ය.

iii. මහාකාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ය. iv. උපාලි තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ය.

39. දස අසුභ අතරින් "**විපුබ්බක**" යන්නෙහි අදහස වන්නේ,

i. ඉදිමී ගිය මළසිරුර යි. ii. සිදුරු වී ගිය මළසිරුර යි.

iii. සැරව වැගිරෙන මළසිරුර යි. iv. ලේ වැගිරෙන මළසිරුර යි.

40. දස අකැප වස්තු අතරින් "**වරක් වළඳා අවසන් කොට, තවත් ගමකට ගොස් දන් වැළඳීම කැප ය.**" යන අදහස දැක්වෙන වරණය වන්නේ,

i. සිඞ්ගිලෝණකප්ප ය. ii. අනුමතිකප්ප ය. iii. ආචිණ්ණකප්ප ය. iv. ගාමාන්තරකප්ප ය.

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விக் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)**
ஆண்டிறுதிப் பரீட்சை – 2022 (2023)
Year End Term Test – 2022 (2023)

පැය තුනයි

**ත්‍රිපිටක ධර්මය - II** **4 ශ්‍රේණිය**

❖ **I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II සහ III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I. සඟ ගුණ අතරින් අඤ්ජලිකරණීය ගුණයෙහි ඇතුළත් **"අභිවාදන"** සහ **"පච්චුපට්ඨාන"** යන පද දෙකෙහි අර්ථ වෙන වෙන ම ලියන්න.
II. පෙළ අටුවාවට අනුව යුගාසන ධර්ම දේශනාවක දී භාවිත කළ ක්‍රම තුනකි. ඉන් **දෙකක්** ලියන්න.
III. විනය පිටකයේ ඛන්ධක විනයට අයත් ග්‍රන්ථ **දෙක** නම් කරන්න.
IV. පුද්ගල ජීවිතය අර්ථවත් කර ගැනීම උදෙසා බුදුදහමේ ඉගැන්වෙන සතර සංග්‍රහ වස්තු නම් කරන්න.
V. අප්පමඤ්ඤා චෛතසික **දෙක** නම් කරන්න.
VI. සමථ භාවනාව වැඩීමෙන් ලැබිය හැකි ආනිසංසවලට අයත් ''පඤ්ච අභිඤ්ඤා'' අතරින් **දෙකක්** නම් කරන්න.
VII. සතර ඍද්ධිපාද නම් කරන්න.
VIII. පරිනිර්වාණයෙහි ආකාර **දෙක** නම් කරන්න.
IX. මජ්ඣිම නිකායේ මහාකම්මවිභංග සූත්‍රයේ සඳහන් වන පරිදි බෞද්ධ කර්ම සංකල්පයේ ප්‍රධාන ප්‍රභේද **දෙක** නම් කරන්න.
X. සතර පාරාජිකා නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

## II කොටස

02. I. පහත සඳහන් ගාථා අතරින් **දෙකක්** සම්පූර්ණ කරන්න.

1. පඨවීසමෝ නො විරුජ්ඣති ........
2. රමණීයානි අරඤ්ඤානි .........
3. සේලෝ යථා එකඝනෝ .......
4. උදකං හි නයන්ති නෙත්තිකා ......

II. සම්පූර්ණ කරන ලද එක් ගාථාවකට අදාළ නිදාන කතාව ලියන්න.

(ලකුණු 6 + 4 = 10)

03. I. **''උපසම්පදාව''** යන වචනයෙහි සරල අදහස ලියන්න.

II. **''සතර සංවර ශීලය''** අතරින් තුනක් නම් කරන්න.

III. **''නිස්සය ධර්ම''** පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

04. I. ව්‍යග්සපජ්ජ සූත්‍රයට අනුව පරලොව යහපත පිණිස හේතුවන කරුණු **හතර** නම් කරන්න.

II. **''ආරක්ඛ සම්පදා''** යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

III. පස්කම් සුවය වින්දනය කරමින් කාමභෝගී ලෞකික දිවියක් ගත කරන ගිහි පුද්ගලයාගේ මෙලොව දියුණුව උදාකර කර ගැනීමට, ව්‍යග්සපජ්ජ සූත්‍ර දේශනාවෙන් ලැබෙන පිටිවහල විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

## III කොටස

05. I. ප්‍රකීර්ණක චෛතසික අතරින් **හතරක්** නම් කරන්න.

II. විරති චෛතසික පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

III. කුසල චෛතසික බෙදෙන ප්‍රධාන කොටස් නම් කර, කුසල චෛතසිකයන්ගෙන් යුක්ත වූ සිත කුමන අයුරින් ක්‍රියාත්මක වන්නේ දැ යි පෙන්වා දෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06. I. චතුරාර්ය සත්‍යය පිළිබඳ ව හඳුන්වා ඇති සූත්‍ර **හතරක්** නම් කරන්න.

II. දුක්ඛආර්ය සත්‍යය කෙටියෙන් පැහැදිලි කරන්න.

III. සත්වයා සසර දුකින් මිදීමට නිර්වාණාවබෝධය ලැබිය යුතු ය. ඒ සඳහා මැදුම් පිළිවෙතෙහි වැදගත්කම පෙන්වා දෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. I. දස සංයෝජන බෙදෙන ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න.

II. ඉන් එක් කොටසක් පිළිබඳ ව පැහැදිලි කරන්න.

III. සසරින් එතෙර වීමට බාධා පමුණුවමින් සත්ත්වයා සසරෙහි නැවත නැවත ඇද බැඳ තබන දස සංයෝජනයන්ගේ බලපෑම කෙබඳු දැ යි පෙන්වා දෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

08. I. වජ්ජිපුත්තක භික්ෂූන් ශාසන විරෝධී දස අකැප වස්තුව පිළිගෙන තිබූ බවත්, එය දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ බවත්, සඳහන් වන ඓතිහාසික මූලාශ්‍රය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

II. පළමු ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා බලපෑ දුරස්ථ හේතු තුනක් ලියන්න.

III. සම්බුදු සසුනේ චිරස්ථිතිය සඳහා තෙවන ධර්ම සංගායනාවේ උපයෝගිතාව අගයන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]
අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

| 03 | S | I |
|---|---|---|

## 04 ශ්‍රේණිය

## (03) ත්‍රිපිටක ධර්මය - I පත්‍රය

පැ එකයි

**සැලකිය යුතුයි :**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. බුදුරජාණන් වහන්සේ ත්‍රිවිධ ලෝකය පිළිබඳ සර්වප්‍රකාරයෙන් ම දැන වදාළ බැවින්,
   (1) සුගත නම් වන සේක.   (2) ලෝකවිදූ නම් වන සේක.
   (3) අරහං නම් වන සේක.   (4) භගවා නම් වන සේක

2. උතුම් ශ්‍රී සද්ධර්මයේ ගුණ අතරින් **එහිපස්සිකො** යන්නෙන් අදහස් වන්නේ,
   (1) එව බලව යැයි විවෘත ව කිව හැකි බව ය.
   (2) තමා විසින් ම අවබෝධ කර ගත යුතු බව ය.
   (3) තමාට මෙලොව දී ම අත්දැකිය හැකි බව ය.
   (4) තථාගතයන් වහන්සේ විසින් මනාකොට දේශනා කර ඇති බව ය.

3. මහා සංඝරත්නයේ ගුණ අතරින් **ආහුනෙය්‍ය** යන්නෙන් අදහස් වනුයේ,
   (1) පරලොව සුව පතා දෙන දානය පිළිගැනීමට සුදුසු බව ය.
   (2) දුර බැහැර සිට ගෙනවුත් පුදන සිවුපසය පිළිගැනීමට සුදුසු බව ය.
   (3) නෑදෑ හිත මිතුරන් උදෙසා වෙන් කළ ආගන්තුක සත්කාර පවා පිළිගැනීමට සුදුසු බව ය.
   (4) ලෝකයාට උතුම් පින් කෙතක් වන බව ය.

4. ගෞතම සම්බුද්ධ සාසනයෙහි මහා ශ්‍රාවකයන් වහන්සේලා අතර මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ............. ය.
   (1) ද්විතීය ශ්‍රාවකයන් වහන්සේ   (2) චතුර්ථ ශ්‍රාවකයන් වහන්සේ
   (3) තෘතීය ශ්‍රාවකයන් වහන්සේ   (4) පංචම ශ්‍රාවකයන් වහන්සේ

5. අනිත්‍ය පිළිබඳව ශ්‍රවණය කළ ධර්ම දේශනාව අවසානයේ පටාචාරා තෙරණිය සිවුපිළිසිඹියාපත් රහත් ඵලයට පත් වූයේ,
   (1) මරණානුස්සති භාවනාව වැඩීමෙනි.
   (2) කායගතානුස්සති භාවනාව වැඩීමෙනි.
   (3) වේදනානුස්සති භාවනාව වැඩීමෙනි.
   (4) චිත්තානුස්සති භාවනාව වැඩීමෙනි.

6. නූතන සම්භාව්‍ය අධ්‍යාපනයේ ප්‍රදීපස්ථම්භයක් වූ විද්‍යෝදය විද්‍යාස්ථානය ආරම්භ කරන ලද්දේ,
   (1) හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් ය.
   (2) රත්මලානේ ධම්මාලෝක නාහිමියන් ය.
   (3) වේරුකානේ චන්දවිමල නාහිමියන් ය.
   (4) හේන්පිටගෙදර ඤාණසීහ නාහිමියන් ය.

7. “ **විද්‍යාලංකාර ශාස්ත්‍රශාලාව** ” නිර්මාතෘ රත්මලානේ ධම්මාලෝක නාහිමියන් උපත ලැබූ යේ,
   (1) 1825 මැයි මස 18 වෙනිදා ය.   (2) 1828 මැයි මස 28 වෙනිදා ය.
   (3) 1828 මැයි මස 30 වෙනිදා ය.   (4) 1838 මැයි මස 28 වෙනිදා ය.

[ 2 වැනි පිටුව බලන්න]

8. නූතන යතිවරු අතරින් මහා **පැරකුම්භා සිරිත** යන ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
   (1) හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් ය.
   (2) රත්මලානේ ධම්මාලෝක නාහිමියන් ය.
   (3) හේන්පිටගෙදර ඤාණසීහ නාහිමියන් ය.
   (4) රේරුකානේ චන්දවිමල නාහිමියන් ය.

9. විශාඛා සිටු දේවිය විසින් ඉදිකළ පූර්වාරාමයෙහි බුදුරජාණන් වහන්සේ .................... වැඩ සිටියහ.
   (1) සය වසක් (2) පස් වසක්
   (3) සිවු වසක් (4) තුන් වසක්

10. බුදුදහම නඟා සිටුවීම උදෙසා ඉමහත් සේවයක් කළ අනගාරික ධර්මපාල තුමන් උපත ලබන ලද්දේ,
   (1) 1764 සැප්තැම්බර් 17 වන දිනයි. (2) 1854 ජුනි 16 වන දිනයි.
   (3) 1864 මැයි 25 වන දිනයි. (4) 1864 සැප්තැම්බර් 17 වන දිනයි.

11. බෙහෙත් වර්ග භාවිතය පිළිබඳව නීති රීති මහාවග්ග පාළියේ ............................... සඳහන් වේ.
   (1) භේසජ්ජක්ඛන්ධකයෙහි (2) මහාක්ඛන්ධකයෙහි
   (3) චම්මක්ඛන්ධකයෙහි (4) කෝසම්බක්ඛන්ධකයෙහි

12. උපසපන් භික්ෂුණියක් විසින් අරක්ෂා කළ යුතු **සංඝාදිසේස** ශික්ෂා පද ගණන,
   (1) දහයකි. (2) පහළොවකි.
   (3) දාසයකි. (4) දාහතකි.

13. සංඝ උපෝසථ කර්මය උපසම්පදා භික්ෂූන් වහන්සේලා ....................... සහභාගිත්වයෙන් සිදු කරනු ලබති.
   (1) එක නමකගේ (2) දෙනමකගේ
   (3) තුන් නමකගේ (4) හතරනමකගේ

14. ධම්මඤ්ඤූ සූත්‍රයට අනුව **ධම්මඤ්ඤූ** යනුවෙන් අදහස් වන්නේ,
   (1) පමණ ගැන දැන ගැනීම යි. (2) කාලය ගැන දැන ගැනීම යි.
   (3) අර්ථය ගැන දැන ගැනීම යි. (4) ධර්මය ගැන දැන ගැනීම යි.

15. නිධිකණ්ඩ සූත්‍රයේ සඳහන් පරිදි "**තමන් ඉගෙන ගත් ශාස්ත්‍ර හා පුරුදු කරන ලද විද්‍යා**" ආදිය තිබූ තැනම පවතින බැවින් එය හඳුන්වන්නේ,
   (1) ජංගම නිධාන නමින් ය. (2) ථාවර නිධාන නමින් ය.
   (3) අංගසම නිධාන නමින් ය. (4) අනුගාමික නිධාන නමින් ය.

16. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් ධනය නොනැසෙන දොරටු අතර **න අක්ඛධුත්තෝ** යන්නෙන් අදහස් වන්නේ,
   (1) ස්ත්‍රී ලෝලියෙකු නොවීමයි. (2) සුරා ලෝලියෙකු නොවීමයි.
   (3) සූදු ලෝලියෙකු නොවීමයි. (4) කලණ මිතුරන් සහය ඇත්තෙකු වීමයි.

17. ප්‍රකීර්ණක චෛතසික පමණක් ඇතුළත් වරණය වන්නේ,
   (1) විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය (2) විතක්ක, විචාර, චේතනා, විරිය
   (3) ඵස්ස, විචාර, අධිමොක්ඛ, වේදනා (4) විරිය, විචාර, අධිමොක්ඛ, වේදනා

18. අකුසල චෛතසික අතර **ඉස්සා** යනුවෙන් අදහස් වන්නේ,
   (1) මානය යි. (2) ඊර්ෂ්‍යාව යි.
   (3) ක්‍රෝධය යි. (4) ද්වේශය යි.

19. **අත්තානුවාද භය** යනුවෙන් අදහස් වන්නේ,
   (1) තමා තමාට දොස් පවර ගන්නෙ යැයි යන බිය යි. (2) අනුන් තමාට දොස් නගති යි යන බිය යි.
   (3) දඬුවමට බිය යි. (4) දුගතියට බිය යි.

20. පංච බල ධර්ම පිළිවෙළින් ඇතුළත්ව ඇති වරණය තෝරන්න.
   (1) සද්ධා, සීල, සති, සමාධි, පඤ්ඤා (2) සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා
   (3) විරිය, සීල, සති, සමාධි, පඤ්ඤා (4) සති, සමාධි, සීල, භාවනා, සද්ධා

21. බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙරේ දී හතළිස් කෝටියක් ධනය ඇති ආනන්ද නම් **මසුරු සිටාණන්ට හා මූලසිරි පුතුට** ................................. යන ගාථාව දේශනා කළ සේක.
(1) පුත්තාමත්ථි ධනම්මත්ථි (2) යාවජීවම්පි චේ බාලෝ
(3) යෝ බාලෝ මඤ්ඤති බාල්‍යං (4) චරන්ති බාලා දුම්මේධා

22. දැන් පමණක් නොව පෙරත් මෙසේ ම කෙළෙහි ගුණ සලකන කෙනෙක් යැයි වදාරා **අලීන චිත්ත ජාතකය** දේශනා කරන ලද්දේ,
(1) මුගලන් තෙරුන්ට ය. (2) සැරියුත් තෙරුන්ට ය.
(3) ලකුණ්ඨක භද්දිය තෙරුන්ට ය. (4) මහාකාශ්‍යප තෙරුන්ට ය.

23. තමා අදහන දෘෂ්ටිය ම සත්‍ය යි. අනෙක් සියල්ල බොරු යැයි ඇදහීම වන්නේ,
(1) අභිජ්ඣා කායගන්ථය යි. (2) ව්‍යාපාද කායගන්ථය යි.
(3) සීලබ්බත පරාමාස කායගන්ථය යි. (4) ඉදං සච්චාභිනිවෙස කායගන්ථය යි.

24. දස අසුභ කර්මස්ථාන අනුව **විච්ඡිද්දක** යන්නෙන් අදහස් වන්නේ,
(1) ඉදිමී ගිය මළ සිරුර ය. (2) සිදුරු වී ගිය මළ සිරුර ය.
(3) ලේ වැගිරෙන මළ සිරුර ය. (4) සැරව වැගිරෙන මළ සිරුර ය.

25. විවිධ වූ ඍද්ධි බල පෑ හැකි නුවණ වන්නේ,
(1) දිබ්බචක්ඛු ඤාණය යි. (2) ඉද්ධිවිධ ඤාණය යි.
(3) දිබ්බසෝත ඤාණය යි. (4) පරචිත්තවිජානන ඤාණය යි

26. **මහා කම්මවිභංග සූත්‍රයේ සඳහන් සිතින් සිදුවන අකුස ධර්වලට අයත් නොවන්නේ.**
(1) අභිධ්‍යා. (2) ව්‍යාපාද.
(3) මිථ්‍යා දෘෂ්ටි (4) සම්ඵප්පලාප

27. අටාකාර වූ විචිකිච්ඡාව අතරින් **අතීතය පිළිබඳ සැක කිරීම** .................... නම් වේ.
(1) අපරන්තෙ කඞ්ඛති (2) පුබ්බන්තෙ කඞ්ඛති
(3) පුබ්බන්තාපරන්තෙ කඞ්ඛති (4) සික්ඛාය කඞ්ඛති

28. පඤ්චස්කන්ධයෙහි දැක්වෙන **සංඛාර** යන්නෙන් අදහස් වන්නේ,
(1) සිතට නැගෙන හොඳ හෝ නරක සිතුවිලි ය.
(2) මොළයත් හදවතත් අතර ඇසුරු කරගෙන පැවතීම ය.
(3) දැනුණු යමක් හඳුනා ගැනීම ය.
(4) සතර මහා භූතයන්ගෙන් සැදුණු ශරීරය ය.

29. පහත A කොටසෙහි සඳහන් පාලි පදවලට ගැලපෙන අර්ථ B කොටසෙහි ඇතුළත් වේ. A කොටසෙහි පාලි පදවල පිළිවෙළට අනුව, B කොටසෙහි නිසි අක්ෂර පිළිවෙළ සහිත වරණය තෝරන්න.

| <u>A කොටස</u> | <u>B කොටස</u> |
|---|---|
| i කාමරාග | A. විවිධ සිල් ව්‍රතවලට වහල් වීම |
| ii පටිඝ | B. සිතතුළ ඇති වන ගැටීම |
| iii විචිකිච්ඡා | C. රූපාදි අරමුණු පිළිබඳ ඇති වන රාගය |
| iv සීලබ්බත පරාමාස | D. බුද්ධාදි අටතැන්හි ඇතිවන සැකය |

(1) B, A, C, D (2) C, A, C, D (3) A, B, C, D (4) C, B, D, A

30. පූර්ණ කාශ්‍යපයන්ගේ ඉගැන්වීම වන්නේ,
(1) අකිරිය වාදය යි. (2) නියති වාදය යි.
(3) උච්ඡේද වාදය යි. (4) අමරා වික්ඛේප වාදය යි.

31. තුන්වන ධර්ම සංගායනා කාලය එළඹෙන විට බෙදී ගිය අටළොස් නිකායන් අතරින් ථෙරවාදී ශාඛාවක් වන්නේ,
(1) ගෝකුලික ය. (2) එකබ්බෝහාරික ය.
(3) බාහුලික ය. (4) මහිංසාසක ය.

32. තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස, ධර්මාශෝක රජු රටවල් නවයක සසුන පිහිටුවීය. ඒ අනුව වනවාසී දේශයට වැඩම කළේ,
    (1) මජ්ඣන්තික තෙරුන් වහන්සේ ය. (2) මහාදේව තෙරුන් වහන්සේ ය.
    (3) රක්ඛිත තෙරුන් වහන්සේ ය. (4) මජ්ඣිම තෙරුන් වහන්සේ ය.

33. මුළුමහත් ජනතාව තමාගේ දරුවන් යැයි ලොවට හඬගා කීවා පමණක් නොව ක්‍රියාවෙන් ද කටයුතු කළ පාලකයා වූයේ,
    (1) බින්දුසාර රජු ය. (2) ධර්මාශෝක රජු ය.
    (3) චන්ද්‍රගුප්ත රජු ය. (4) බිම්බිසාර රජු ය.

34. රාත්‍රී කාල හතරක් සහ දවල් කාල තුනකින් සමන්විත පිරිත් දේශනාව වන්නේ,
    (1) වරු පිරිත යි. (2) තුන්වරු පිරිත යි.
    (3) තිස්පැය හතේ පිරිත යි. (4) තිස්පැය තුනේ පිරිත යි.

35. **කුල දේවතා** යන ගෞරව නාමයෙන් හඳුන්වනු ලබන්නේ,
    (1) මහා සංඝරත්නය ය. (2) දෙවි දේවතාවන් ය.
    (3) රජවරුන් ය. (4) මැති ඇමතිවරුන් ය.

36. සතර සංග්‍රහ වස්තූන් නිවැරදිව සඳහන් වරණය වන්නේ,
    (1) දානය, සීලය, ප්‍රියවචනය, සමානාත්මතාවය
    (2) ප්‍රියවචනය, පරිත්‍යාගය, දානය, සීලය
    (3) දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය
    (4) දානය, සීලය, ප්‍රියවචනය, සමානාත්මතාවය

37. **පින් කළ ඔබ නොබෝ දිනකින් රහත්වන්නෙහි** යැයි පවසා තිබූ බුද්ධ වචනය පසක් කරමින් ආනන්ද හිමියෝ ......................... භාවනාව වඩා රහත් ඵලයට පත් විය.
    (1) බුද්ධානුස්සති (2) ධම්මානුස්සති
    (3) මරණානුස්සති (4) කායගතාසති

38. අප්පමඤ්ඤා චෛතසික පමණක් අයත් වන වරණය තෝරන්න.
    (1) කරුණා, මුදිතා (2) මෙත්තා, මුදිතා
    (3) මෙත්තා, කරුණා (4) මුදිතා, උපේක්ඛා

39. **සන්නිධිකාර පරිභෝජනය** නම් ශික්‍ෂා පදය අයත් වන්නේ,
    (1) සේඛියාවලට ය. (2) පචිතිවලට ය.
    (3) නිසග්ගිපචිතිවලට ය. (4) පාටිදේසනීවලට ය.

40. විනය පැනවීමේ අපේක්‍ෂා දහයකි. ඉන් **ශාසනික ශික්‍ෂාවට අනුග්‍රහය පිණිස** යන අදහස ඇතුළත් වරණය වන්නේ,
    (1) සංඝඵාසුතාය (2) සංඝසුට්ඨුතාය
    (3) විනයානුග්ගහාය (4) සද්ධම්මට්ඨිතියා

* * *

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 03 | S | II |
|---|---|---|

## පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

පැ තුනයි.

## 04 ශ්‍රේණිය

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## (3) ත්‍රිපිටක ධර්මය - II පත්‍රය

**I කොටසේ ප්‍රශ්නය ද, II සහ III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද, තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I - කොටස

**01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. පසළොස් චරණ ධර්ම අතරින් **හතරක්** නම් කරන්න.

ii. කෙලෙසුන්ගෙන් මිදෙන ආකාර පහ හෙවත් පඤ්ච විමුක්තියේ අංග **හතරක්** ලියන්න.

iii. පුබ්බකරණ **හතර** නම් කරන්න.

iv. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි සඳහන් ධනය නැසෙන දොරටු **හතරක්** නම් කරන්න.

v. ශෝභන සාධාරණ චෛතසික **හතරක්** නම් කරන්න.

vi. "යේ ධම්මා හෙතුප්පභවා" යන ගාථාව සම්පූර්ණ කරන්න.

vii. ධර්මාශෝක රජුගේ ශාසනික සේවාවන් **හතරක්** ලියන්න.

viii. **සතර** සංවර සීලය නම් කරන්න.

ix. **සතර** ආරුප්ප නම් කරන්න.

x. පංච අභිඥා අතරින් **හතරක්** නම් කරන්න.

**(ලකුණු 2×10 = 20)**

## II - කොටස

2. i. මහා සංඝරත්නයේ ගුණ ඇතුළත් පාලි පාඨය ලියන්න.

ii. **අඤ්ජලිකරණීය** ගුණය පැහැදිලි කරන්න.

iii. භික්ෂුව ලෝකයාගේ වන්දනාමාන හා පුද පූජාවන්ට පත්වීම සඳහා සභගුණවල ඇති උපයෝගිතාව පැහැදිලි කරන්න.

**(ලකුණු 2+3+5=10)**

03. i. පහත සඳහන් ගාථා අතරින් **දෙකක්** සම්පූර්ණ කරන්න.

a. යෝ බාලෝ මඤ්ඤති බාල්‍යං ........
b. යථා පි රහදෝ ගම්භීරෝ .........
c. දීඝා ජාගරතෝ රත්ති.......
d. උය්‍යුඤ්ජන්ති සතීමතෝ ......

ii. **නහි පාපං කතං කම්මං** යන ගාථාවට අදාළ නිදාන කතාව ලියන්න. **(ලකුණු 6+4=10)**

[ 2 වැනි පිටුව බලන්න]

04. i. නිධිකණ්ඩ සූත්‍රයෙහි සඳහන් නිධාන **හතර** නම් කරන්න.

ii. ඉන් එක් නිධානයක් පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

iii. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය පුද්ගලාභිවෘද්ධියට මග පාදයි පෙන්වා දෙන්න.

**(ලකුණු 2+3+5=10)**

## III - කොටස

05. i. දස කසිණ අතරින් **හතරක්** නම් කරන්න.

ii. රාග චරිතයාගේ ස්වභාවය පැහැදිලි කරන්න.

iii. "ගැටලු නිරාකරණයට සුදුසු මගකි, භාවනාව." උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

**(ලකුණු 2+3+5=10)**

06. i. සබ්බචිත්ත සාධාරණ චෛතසික අතරින් **හතරක්** නම් කරන්න.

ii. සද්ධා චෛතසිකය පිළිබඳව විස්තර කරන්න.

iii. "චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි....." උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

**(ලකුණු 2+3+5=10)**

07. i. උපසම්පදා ක්‍රම **හතරක්** නම් කරන්න.

ii. ගෞතම සම්බුදු සසුනේ උපසම්පදාවේ ආරම්භය පිළිබඳව පැහැදිලි කරන්න.

iii. සංඝ සමාජයේ සමගිය හා උන්නතිය උදෙසා උපෝසථ කර්මයන්ගේ වැදගත්කම පෙන්වා දෙන්න.

**(ලකුණු 2+3+5=10)**

* * *